# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2019

# 45 - බෞද්ධ ශිෂ්ටාචාරය- නව නිර්දේශය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය

**I පත්‍රය-** කාලය - පැය 02 යි.

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

**IIපත්‍රය-** කාලය - පැය 03 යි.

මෙම ප්‍රශ්නපත්‍රය IහාIIවශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.

**Iකොටස** - ව්‍යුහගත ප්‍රශ්න තුනකි. ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්නයක කොටස් පහකි. එක් කොටසකට ලකුණු 04 බැගින් ලකුණු 20 ක් හිමි වේ.

**IIකොටස** - රචනා වර්ගයේ ප්‍රශ්න පහකි. ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්නයක කොටස් දෙකකි. එක් කොටසකට ලකුණු 10 බැගින් ලකුණු 20 ක් හිමි වේ.

**II පත්‍රය සඳහා මුළු ලකුණු** = 100

**අවසාන ලකුණු ගණනය කිරීම** : **Iපත්‍රය** = 100

**II පත්‍රය** = 100

**අවසාන ලකුණ** = 200 - 2 =100

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ........................................................ √ △ $\frac{4}{5}$

(ii) ........................................................ √ △ $\frac{3}{5}$

(iii) ........................................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

බෞද්ධ ශිෂ්ටාචාරය I
பௌத்த நாகரிகம் I
Buddhist Civilization I

45 S I

2019.08.05 / 0830 - 1030

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** උත්තරය තෝරාගෙන එය **උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

1. බුද්ධකාලීන භාරතයේ පැවැති ආගම් හා දර්ශන අතුරෙන් වෛදික ආගම වෙන්කර හඳුනා ගැනීමට වඩාත් උචිත ප්‍රකාශය කුමක් ද?
   (1) ඊශ්වර නිර්මාණවාදය හා නියති පරිණාමවාදය පිළිගැනීම
   (2) යාගය හා නියති පරිණාමවාදය පිළිගැනීම
   (3) ඊශ්වර නිර්මාණවාදය හා සංසාරශුද්ධිවාදය පිළිගැනීම
   (4) නියති පරිණාමවාදය හා කර්ම මාර්ගය පිළිගැනීම
   (5) කර්ම මාර්ගය හා ඊශ්වර නිර්මාණවාදය පිළිගැනීම

2. 'යාගය' පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි **නො වන්නේ**, කුමන ප්‍රකාශය ද?
   (1) 'උද්ගාතෘ' යනු යාගයට ආරාධනා කරන්නා වේ.
   (2) බ්‍රහ්මසහව්‍යතාව සඳහා එක ම මාර්ගය යාගයයි.
   (3) වේද ග්‍රන්ථයන්හි යාගය ගැන තොරතුරු දැක්වේ.
   (4) යාගයක් සාර්ථක කර ගැනීම සඳහා බ්‍රාහ්මණ පූජකවරුන්ගේ සහභාගිත්වය අනිවාර්ය වේ.
   (5) යාගය ඉහළ වර්ණවලට පමණක් සීමා වූ පූජා චාරිත්‍රයකි.

3. සත්ත්වයාගේ මරණින් මතු පැවැත්ම, පරලොව, කුශලා'කුශල කර්මයන්ගේ ඵල විපාක ආදිය පිළිබඳ විමසන ලදු ව බුද්ධකාලීන ඇතැම් ශ්‍රමණයන් නිශ්චිත පිළිතුරක් නො දුන් බව සංජය බෙල්ලට්ඨිපුත්තගේ ඉගැන්වීම්වලින් පැහැදිලි වේ. එසේ පිළිතුරු නො දීමට හේතු වන සාධක හතරක් බුදුසමය පෙන්වා දී ඇත. එම හේතු හතරට අයත් **නො වන** ප්‍රකාශය තෝරන්න.
   (1) උපාදානයට ඇති බිය හා පිළිකුල නිසා පිළිතුරු නො දීම
   (2) සංසාරයට ඇති බිය හා පිළිකුල නිසා පිළිතුරු නො දීම
   (3) මුසාවක් සිදුවේයැ'යි මුසාවට ඇති බිය හා පිළිකුල නිසා පිළිතුරු නො දීම
   (4) පිළිතුරු දෙනු ලබන කල්හි ප්‍රතිප්‍රශ්න විචාරනු ලබති'යි ඇති බිය නිසා පිළිතුරු නො දීම
   (5) නුවණ මඳ බැවින්, බෙහෙවින් මෝඩ බැවින් හා ප්‍රශ්නවලට පිළිතුරු දීමේ ශක්තියක් නැති බැවින් පිළිතුරු නො දීම

4. බුද්ධකාලීන ප්‍රකට ශාස්තෘවරයකු වූ මක්ඛලීගෝසාලතුමන්ගේ ප්‍රධාන ඉගැන්වීම වූයේ,
   (1) උච්ඡේද භෞතිකවාදයයි.
   (2) පරම අවිහිංසාවාදයයි.
   (3) අමරා වික්ඛෙපවාදයයි.
   (4) අකිරියවාදයයි.
   (5) නියති පරිණාමවාදයයි.

5. බුද්ධකාලීන භාරතයේ පැවැති සොළොස් මහා ජනපද අතුරෙන් විශාලතම නියෝජිත මන්ත්‍රී මණ්ඩලයකින් පාලනය කරනු ලැබූ ජනපදය ලෙස සැලකෙන්නේ,
   (1) මගධ ජනපදයයි.
   (2) කොසොල් ජනපදයයි.
   (3) වජ්ජි ජනපදයයි.
   (4) මල්ල ජනපදයයි.
   (5) කුරු ජනපදයයි.

**6.** කෘෂි ආර්ථිකයට මුල්තැනක් දුන් පැරණි භාරතයේ, ජාත්‍යන්තර වශයෙන් වාණිජ්‍යකරණය දියුණු තත්ත්වයකට පත්ව තිබුණු බවට දැක්විය හැකි වඩාත් සුදුසු සාධකය වන්නේ

(1) සේද මාර්ගය ඔස්සේ සිදු වූ වෙළඳාමයි. (2) නව නගර නිර්මාණය වීමයි.
(3) භාණ්ඩ නිෂ්පාදනය ඉහළ යාමයි. (4) ගංගාවන් ඔස්සේ භාණ්ඩ ප්‍රවාහනය කිරීමයි.
(5) කෘෂි නිෂ්පාදනවලින් ස්වයංපෝෂණය වීමයි.

**7.** බුදුරජාණන් වහන්සේ ශාස්වත-අශාස්වත යන අන්තද්වයට නො පැමිණ සුන්දර වූ නිවනට ගිය බැවින් ද, සුදුසු තැන සුදුසු වචන යහපත් ව කියන බැවින් ද සුවිශේෂ නාමයකින් හඳුන්වන බව නව අරහාදි බුදුගුණ විවරණයෙන් පැහැදිලි වේ. එම බුදුගුණය හැඳින්වෙන්නේ,

(1) ලෝකවිදූ නමිනි. (2) අරහං නමිනි.
(3) සුගත නමිනි. (4) සම්මාසම්බුද්ධ නමිනි.
(5) භගවා නමිනි.

**8.** "බුදුරජාණන් වහන්සේ වනාහි උන්වහන්සේ විසින් දේශනා කරන ලද සියලු ම ගුණධර්මයන්ගේ ප්‍රතිමූර්තියයි. හතළිස් පස් වසරක කාලය තුළ දී තමන් විසින් ප්‍රකාශ කරන ලද වචන උන්වහන්සේ ක්‍රියාවට නැගූහ. කිසිදු දුබලතාවක් හෝ පහත් හැඟීමක් හෝ උන්වහන්සේගෙන් කිසිවිටෙකත් දෘශ්‍යමාන නො විය. ලෝකයට ඉතාම පරිපූර්ණ ආචාරධර්ම පද්ධතියක් ඉදිරිපත් කරන ලද්දේ බුදුරජාණන් වහන්සේ විසිනි." බුදුරජාණන් වහන්සේ පිළිබඳ නූතන ඇගයීමක් වන මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(1) මහාචාර්ය ලක්ෂ්මී නරසු (2) ඇල්බට් අයින්ස්ටයින් (3) බර්ට්‍රන්ඩ් රසල්
(4) මහාචාර්ය මැක්ස් මුලර් (5) එඩ්වින් ආර්නෝල්ඩ්

**9.** ප්‍රථම සංගායනාව අවසානයේ දී විනය පිටකයත්, සූත්‍ර පිටකයේ නිකාය පහත් කටපාඩමින් පවත්වා ගෙන යාමට මහතෙරවරුන් හා උන්වහන්සේලාගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා වෙත භාර කරන ලද බව ශාසන ඉතිහාසයේ සඳහන් වේ. එහි ලා දීඝනිකායට අයත් සූත්‍ර මුඛ පරම්පරාවෙන් පවත්වා ගෙන යාමට භාර කරන ලද්දේ,

(1) සැරියුත් හිමියන්ගේ ශිෂ්‍ය පරම්පරාවටයි.
(2) උපාලි හිමියන් ප්‍රමුඛ ශිෂ්‍ය පරම්පරාවටයි.
(3) මහාකාශ්‍යප හිමියන් ප්‍රමුඛ ශිෂ්‍ය පරම්පරාවටයි.
(4) අනුරුද්ධ හිමියන් ප්‍රමුඛ ශිෂ්‍ය පරම්පරාවටයි.
(5) ආනන්ද හිමියන් ප්‍රමුඛ ශිෂ්‍ය පරම්පරාවටයි.

**10.** බුද්ධකාලීන භික්ෂුණී ශාසනයේ ප්‍රකට භික්ෂුණියක වූ ඛේමා රහත් තෙරණින් වහන්සේට පිරිනැමූ අගතනතුර කුමක් ද?

(1) චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අගතනතුර
(2) ප්‍රඥාසම්පන්න භික්ෂුණීන් අතර අගතනතුර
(3) සුමධුර ලෙස දහම් දෙසන භික්ෂුණීන් අතර අගතනතුර
(4) ශික්ෂාකාමී භික්ෂුණීන් අතර අගතනතුර
(5) ප්‍රාතිහාර්ය පෑමෙහි දක්ෂ භික්ෂුණීන් අතර අගතනතුර

**11.** විවාහ පත්වන යුවතිපති දෙදෙනා තුළ ම ගුණධර්ම සතරක් සමාන ව පිහිටි කල්හි සාර්ථක යුගදිවියක් නිර්මාණය වන බව නකුල මාතා-නකුල පිතා යුවලගේ පරමාදර්ශී විවාහ ජීවිතයෙන් පැහැදිලි වේ. සමජීවී සූත්‍රයේ දැක්වෙන එම ගුණධර්ම හතර මොනවා ද?

(1) සද්ධා, සීල, විරිය, බල (2) සද්ධා, සීල, විරිය, පීති
(3) සද්ධා, සීල, හිරි, ඔත්තප්ප (4) සද්ධා, සීල, චාග, පඤ්ඤා
(5) සද්ධා, සීල, විරිය, පඤ්ඤා

**12.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් පුද්ගල ස්වාමිත්වය පැහැදිලි කිරීමට වඩාත් සුදුසු ප්‍රකාශය කුමක් ද?

(1) තමා හිසට තම අතම ය සෙවනැල්ල.
(2) කළ කළ දේ පල පල දේ.
(3) තමා උපමා කොට අනුන්ට හිංසා නො කළ යුතු ය.
(4) පටිච්චසමුප්පන්න ව සියල්ල සිදු වේ.
(5) පිං කරන්නා දෙලොවෙහි ම සතුටු වේ.

**13.** රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳ අග්ගඤ්ඤ සූත්‍රාගත ඉගැන්වීමට අනුව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය කුමක් ද?

(1) වැරදිකරුවන්ට දඬුවම් දීම පාලකයාගේ ප්‍රධාන කාර්යයයි.
(2) පාලකයාට බදු ගෙවීමට ජනතාව බැඳී සිටියි.
(3) පාලකයා 'රාජා' නාමයෙන් හඳුන්වන්නේ මහජනයාගේ කැමැත්තෙන් පත්කර ගත් බැවිනි.
(4) පාලකයා වෙත ඇති බලය ජනතාව විසින් ලබා දෙන ලද්දකි.
(5) සමාජගත දුරාචාර බහුල වීම නිසා පාලකයෙක් පත්කර ගන්නා ලදි.

**14.** බෞද්ධ දේශපාලන දර්ශනය අනුව පාලන තන්ත්‍රයක් යනු සමාජ සුභසාධනය හා ජනතා ශුභසිද්ධිය උදෙසා ම ඇප කැප වූ සංස්ථාවකි. එහි ලා සමස්ත ජනතාවට සමාන ආකල්පයකින් කටයුතු කළ යුතු ය. එනම් යම් යම් අය පිළිබඳ ව පක්ෂග්‍රාහී ව කටයුතු කිරීමෙන් වැළකිය යුතු ය. එසේ අපක්ෂපාතී ව කටයුතු කිරීමට වඩාත් ම අනුබල දෙන බෞද්ධ දේශපාලන මූලධර්මය වන්නේ,
(1) සතර අගතියෙන් වෙන් ව කටයුතු කිරීමයි.
(2) පංචසීල ප්‍රතිපදාව අනුව කටයුතු කිරීමයි.
(3) දසරාජ ධර්ම අනුව රාජ්‍යය මෙහෙයවීමයි.
(4) සප්ත අපරිහානීය ධර්ම ප්‍රගුණ කිරීමයි.
(5) දස සක්විතිවත් අනුගමනය කිරීමයි.

**15.** අපරාධ මර්දනයෙහි ලා දඬුවම ප්‍රමාණවත් නො වන බවත් ජනතාව සදාචාරවත් කිරීම මෙන් ම ආර්ථික ක්ෂේත්‍රයේ වෙනස්වීම් සිදු කොට ආර්ථික වශයෙන් සවිබල ගැන්විය යුතු බවත් බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම පිළිබඳ විමසිලිමත් වීමෙන් පැහැදිලි වේ. රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අතර මෙම අදහස ඇතුළත් වනුයේ,
(1) දස රාජ ධර්මවල ය.
(2) දස සක්විතිවත්වල ය.
(3) සප්ත අපරිහානිය ධර්මවල ය.
(4) කූටදන්ත සූත්‍රාගත රාජ්‍ය පාලන මූලධර්මවල ය.
(5) සතර අගතියෙන් වෙන් ව කටයුතු කිරීමේ මූලධර්මයෙහි ය.

**16.** පුණ්‍ය-පාප, කුසල-අකුසල, සාධු-අසාධු, කරණීය-අකරණීය ආදි පුද්ගලයාගේ සචේතනික ක්‍රියා විනිශ්චයෙහි ලා අම්බලට්ඨිකරාහුලෝවාද සූත්‍රයෙන් ප්‍රකට වන නිර්ණායකය කුමක් ද?
(1) ලෝභ, දෝස, මෝහ චේතනා මුල්කොටගත් ක්‍රියා අකුසල කර්ම වන අතර අලෝභ, අදෝස, අමෝහ සහගත ක්‍රියා කුසල කර්ම වේ.
(2) යම් ක්‍රියාවක විපාකය පසුතැවීමට හේතු වේ නම් අකුසල ක්‍රියා වන අතර යම් ක්‍රියාවක විපාකය පසුතැවීමට හේතු නො වේ නම් කුසල ක්‍රියා වේ.
(3) තමා උපමා කොට අනුන් නො නැසිය යුතු ය.
(4) තමා, ලෝකය හා ධර්මය අධිපති කොට සිතා හොඳ-නරක තීරණය කළ යුතු ය.
(5) තමාට, මෙරමාට හා උභය පක්ෂයට අයහපත් වන ක්‍රියා නරක ක්‍රියා ලෙසත්, යහපත් වන ක්‍රියා හොඳ ක්‍රියා ලෙසත් තීරණය කළ යුතු ය.

**17.** දස පිං කිරියවත්හි එන ගරු බුහුමන් කිරීම ............................ යනුවෙන් හැඳින්වේ.
(1) වෙයාවච්ච (2) අපචායන (3) පත්තිදාන
(4) උපට්ඨාන (5) පත්තානුමෝදනා

**18.** දස අකුසලයන්හි එන 'අභිජ්ඣා' හෙවත් 'අභිද්‍යා' යන්නෙන් අදහස් කරන්නේ,
(1) අවිද්‍යාවයි. (2) ක්‍රෝධයයි. (3) දැඩි ලෝභයයි.
(4) ලජ්ජා නැතිකමයි. (5) කුසීතකමයි.

**19.** පරිසර සංරක්ෂණයෙහි ලා බුදුසමයේ අවධානය කෙතෙක් ද යන්න සූත්‍ර පිටකයේ මෙන් ම විනය පිටකයේ ද එන විවිධ තොරතුරුවලින් පැහැදිලි ය. රුක් රෝපණය, උද්‍යාන නිර්මාණය, ඒ දඬු පාලම් සෑදීම, පැන්හල්, පැන් පොකුණු නිර්මාණය, දිවා රෑ පිං වැඩෙන පිංකම් ලෙස දක්වා තිබීම මෙයට කදිම නිදසුනක් වන අතර එම දේශනාව ඇතුළත් වන්නේ,
(1) සිංසපා සූත්‍රයේ ය. (2) මහාපරිනිබ්බාණ සූත්‍රයේ ය.
(3) වනරෝප සූත්‍රයේ ය. (4) මෙත්ත සූත්‍රයේ ය.
(5) අරියපරියෙසන සූත්‍රයේ ය.

**20.** ධනෝපායනය හා ආර්ථික සුරක්ෂිතතාව තෘප්තිමත් ගෘහස්ථ ජීවිතයකට අත්‍යවශ්‍ය සාධකයකි. දැහැමි ව උපයාගත් ධනය පරිහරණයේදී බුදුසමය පරිභෝජන දර්ශනයක් හඳුන්වා දී තිබේ. එම පරිභෝජන දර්ශනයට අයත් **නො වන** කරුණ කුමක් ද?
(1) අගථිතො (2) අමුච්ඡිතො
(3) අනජ්ඣාපන්නෝ (4) ආදීනවදස්සාවි
(5) සතිමතො

**21.** ධනය ඉපයීමෙහි ලා සැමවිට ම දැහැමි විය යුතු බවත් සාහසික නො විය යුතු බවත් බුදුසමය අවධාරණය කරයි. අල්ලස, දූෂණය, වංචාව, නො දැහැමි වෙළඳාම ආදි අධාර්මික ක්‍රම මෙහි ලා භාවිත නො කළ යුතු ය. ඒ අනුව ධනය ඉපයීමෙහි ලා භාවිත විවිධ නො දැහැමි ක්‍රම අතර 'උක්කෝටන' යනුවෙන් අදහස් කරන්නේ,
(1) හොරට මැනීමයි. (2) හොරට කිරීමයි. (3) අල්ලස් ගැනීමයි.
(4) මං පැහැරීමයි. (5) වංචා කිරීමයි.

**22.** දරිද්‍රතාව වනාහි කාමභෝගී ගිහියාට දුකක් බව උගන්වන බුදුසමය, ආර්ථික සමෘද්ධිය ගෘහස්ථ ජීවිතයට අත්‍යවශ්‍ය සාධකයක් ලෙස අවධාරණය කරයි. මෙම ආර්ථික සමෘද්ධිය පැහැදිලි කිරීමට වඩාත් ම සුදුසු පාරිභාෂික යෙදුම වන්නේ,
(1) උට්ඨාන සම්පදාවයි. (2) සමජීවිකතාවයි. (3) භෝග සුඛයයි.
(4) අත්ථි සුඛයයි. (5) අනණ සුඛයයි.

**23.** බුදුසමය, පඤ්චබලි සංකල්පයෙන් පැහැදිලි කරනුයේ,
(1) ධනෝපායනය පිළිබඳ ක්‍රමවේදයකි. (2) ධන සංරක්ෂණය පිළිබඳ ක්‍රමවේදයකි.
(3) ධන පරිභෝජනය පිළිබඳ විධි නියමයකි. (4) ධන පරිහානිය පිළිබඳ ඉගැන්වීමකි.
(5) ධන ආයෝජනය පිළිබඳ නිර්දේශයකි.

**24.** ආර්ය විනයෙහි බටහිර දිශාවට නමස්කාර කිරීම යනුවෙන් හඳුන්වා ඇත්තේ .......................... විෂයයෙහි යුතුකම් හා වගකීම් ඉටු කිරීමයි.
(1) දෙමාපියන් (2) අඹු-දරුවන් (3) යහළු මිත්‍රයන්
(4) ගුරුවරුන් (5) සේවක-සේවිකාවන්

**25.** තරුණවිය ඉක්ම වූ පුරුෂයකු නව යොවුන් තරුණියක ආවාහකර ගැනීම මූලාශ්‍රයාගත විග්‍රහය අනුව
(1) භෝග විනාශ වීමට හේතුවකි. (2) නිදි වර්ජිත ව සිටීමට හේතුවකි.
(3) පසුතැවීමට හේතුවකි. (4) තෘෂ්ණාව වැඩිවීමට හේතුවකි.
(5) පිරිහීමට හේතුවකි.

**26.** "අඥ බාලයන් ඇසුරු නො කිරීමෙන් යහපතක් ම සිදුවන බව හොඳින් ම දැන සිටි ධම්මික උපාසකතුමා සිල්වත් ගුණවත් පණ්ඩිත ජනයාගේ ඇසුර ම ප්‍රිය කෙළේ ය. සමාජයේ ගරු කටයුතු උතුමන්ට ඉහළින් ම පුදසත්කාර කළ හෙතෙම පූර්වකෘත පුණ්‍ය මහිමයෙන් ද, මනාකොට පිහිටුවා ගත් සිතින් එනම් යහපත් ප්‍රාර්ථනා ඇති සිතින් ද යුක්තව සත්පුරුෂ මිනිසුන් වසන උපද්‍රව රහිත පෙදෙසක වාසය කිරීමට වාසනාවන්ත වූයේ ය." මංගල සූත්‍රයට අනුව මෙම ප්‍රකාශනයෙහි ඇතුළත් මංගල කරුණු ගණන
(1) හතරකි. (2) පහකි. (3) හයකි. (4) හතකි. (5) අටකි.

**27.** "සුකරානි අසාධූනි - අත්තනො අහිතානි ච
යං වෙ හිතං ච සාධුං ච - තං වෙ පරම දුක්කරං"
ඉහත ගාථාවට අනුව ඒකාන්තයෙන් සිදු කිරීමට ඉතා දුෂ්කර කාර්යය වනුයේ,
(1) මනුෂ්‍යාත්මභාවයක් ලබා ගැනීමයි.
(2) බුද්ධෝත්පාද කාලයක උපත ලැබීමයි.
(3) සද්ධර්ම ශ්‍රවණයයි.
(4) තමාට හිත හෝ යහපත පිණිස හේතුවන දේ කිරීමයි.
(5) අනුන්ට හිත හෝ යහපත පිණිස හේතුවන දේ කිරීමයි.

**28.** ප්‍රථම රහත් හැටනම අමතා මුල මැද අග යහපත් වූ ද අර්ථ සහිත වූ ද පරිපූර්ණ වූ ද බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරන්නයැ'යි නියම කළ බුදුරජාණන් වහන්සේ උරුවෙල් දනව්වට වැඩම කොට දහම් දෙසූ බව බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වේ. එහි ප්‍රතිඵලය වූයේ,
(1) යසකුල පුතු බුදුසමය වැළඳ ගැනීමයි.
(2) භද්දවග්ගිය කුමාරවරුන් බුදුසමය වැළඳ ගැනීමයි.
(3) බරණැස් සිටුවරයා තෙරුවන් සරණ යාමයි.
(4) තුන් බෑ ජටිලයන් බුදුසමය වැළඳ ගැනීමයි.
(5) ගවම්පතී කුලපුතු බුදුසමය වැළඳ ගැනීමයි.

**29.** "චරථ භික්ඛවෙ චාරිකං" යන දේශනාවෙහි අන්තර්ගත "මා එකෙන ද්වෙ අගමිත්ථ" යන ප්‍රකාශයෙහි අර්ථ දැක්වීමක් ලෙස සැලකිය හැක්කේ,
(1) සීමිත භෞතික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමයි.
(2) සීමිත මානව සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමයි.
(3) මහජනයාට අවම බරක් දී ආහාර සපයා ගැනීමයි.
(4) සීමිත කාලයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමයි.
(5) සංචාරක ජීවිතයෙන් තොර පැවිදි ජීවිතයක් නොමැති බව තහවුරු කිරීමයි.

**30.** විවිධ අරමුණු හා පරමාර්ථ ඉලක්ක කර ගනිමින් භාරතයේදී පවත්වන ලද ත්‍රිවිධ ථෙරවාද සංගායනා අතුරෙන් තෙවන ධර්ම සංගීතියෙන් අපේක්ෂිත ප්‍රමුඛතම පරමාර්ථය වූයේ,
(1) ධර්ම විනය සුරක්ෂිත කිරීමට භාණකවරුන් පිරිසක් පත් කර ගැනීමයි.
(2) ධර්ම විනය ඒකරාශී කිරීමයි.
(3) නිකාය භේදය ඇතිවීම වැළැක්වීමයි.
(4) නව රට ධර්ම ප්‍රචාරය කිරීමයි.
(5) බුදුසසුන පිරිසිදු කොට සුරක්ෂිත කරලීමයි.

**31.** දෙවන අශෝක නමින් ප්‍රකට කණිෂ්ක අධිරාජයා බුදුසමයේ උන්නතිය සඳහා කළ සුවිශේෂ මෙහෙවරක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) විභාෂා ග්‍රන්ථ රචනා කරවීමයි.
(2) භාණක පරපුරක් ඇති කරවීමයි.
(3) සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර ග්‍රන්ථය රචනා කරවීමයි.
(4) මහා ප්‍රඥා පාරමිතා ග්‍රන්ථය කරවීමයි.
(5) සාධනමාලා ග්‍රන්ථය රචනා කරවීමයි.

**32.** පැරණි භාරතීය කීර්තිමත් අධ්‍යාපන ආයතනයක් වූ වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ විද්‍යා මණ්ඩප භාර ව සිටි ද්වාර පණ්ඩිතවරුන්ගේ ප්‍රමුඛ කාර්යභාරය වූයේ,
(1) ප්‍රවේශ පරීක්ෂණයකින් සිසුන් තෝරා ගැනීමයි.
(2) විෂය නිර්දේශ සැකසීමයි.
(3) පරිපාලන කටයුතු මෙහෙයවීමයි.
(4) විනය කටයුතු පවත්වා ගෙන යාමයි.
(5) ප්‍රවේශ දොරටුවල ආරක්ෂාව සඳහා කටයුතු කිරීමයි.

**33.** මහින්දාගමනයට පෙර ලංකාවේ ස්වදේශික ආගම් මෙන් ම සංක්‍රමණික ආගම් ද පැවැති බවට මූලාශ්‍රය සාධක හමු වේ. ලක්දිව ප්‍රචලිත ජෝතිය, ගිරි, කුම්භණ්ඩ යන පුද්ගලයන් ද සංක්‍රමණික ආගමික සම්ප්‍රදායයක් නියෝජනය කළ බව තහවුරු වී ඇත. එම ආගමික සම්ප්‍රදාය කුමක් ද?
(1) ආජීවක (2) පරිබ්‍රාජක (3) ජෛන
(4) බ්‍රාහ්මණ (5) අචේලක

**34.** ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වාදීමෙන් පසු මිහිඳු මහරහතන් වහන්සේ දෙවන දිනයේදී රජගෙදර කාන්තාවන්ට ..................... තේමා කරගෙන දහම් දෙසන ලදි.
(1) විමානවත්ථු හා පේතවත්ථු
(2) අග්ගික්ඛන්ධෝපම සූත්‍රය
(3) දේවදූත සූත්‍රය
(4) චූල්ලහත්ථිපදෝපම සූත්‍රය
(5) බාලපණ්ඩිත සූත්‍රය

**35.** “මහරජතුමනි, ශාසනය නම් පිහිටියේ ය. එහෙත් මුල්බැස ගත්තේ නැත.” මෙම ප්‍රකාශයෙන් ශ්‍රී ලංකා භූමියෙහි බුදුසසුන ස්ථාවරත්වයට පත් කිරීමට මිහිඳු මාහිමියන් තුළ පැවැති අභිලාෂය ප්‍රකට වේ. එම අරමුණ සපුරා ගැනීමේ මූලික පියවර වශයෙන් උන්වහන්සේ විසින් යෝජනා කරන ලද්දේ,
(1) භික්ෂුණී ශාසනය පිහිටුවිය යුතු බවයි.
(2) යොදුනක් යොදුනක් පාසා චෛත්‍ය ඉදි කළ යුතු බවයි.
(3) ධර්ම සංගීතියක් පැවැත්විය යුතු බවයි.
(4) ස්වදේශිකයකු පැවිදි ව ධර්මවිනය උගෙන විනය දේශනා කළ යුතු බවයි.
(5) රට පුරා ධර්මය ව්‍යාප්ත කළ යුතු බවයි.

**36.** ප්‍රාග් බෞද්ධ ලංකාවේ පූජනීයත්වයට පත් විවිධ දෙවිවරුන් අතර දඩයමට අධිපති දෙවියා ලෙස වියතුන් විසින් ................. හඳුනාගෙන ඇත.
(1) ව්‍යාධදේව (2) පුරදේව
(3) කම්මාරදේව (4) වෙස්සවණදේව
(5) සුමනදේව

**37.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) සංඝමිත්තා රහත් මෙහෙණිය වැඩමවාගෙන ඒම පිණිස අරිට්ඨකුමරු ප්‍රධාන දූත පිරිසක් භාරතයට පිටත් කරන ලදි.
(2) දුටුගැමුණු රජතුමා විසින් කාලප්පාසාදය ඉදිකොට සසුනට පූජා කරන ලදි.
(3) කුපික්කල මහා තිස්ස හිමියන් විසින් දුෂ්කර අවස්ථාවට පත් වලගම්බා රජු පෝෂණය කරන ලදි.
(4) දේවානම්පියතිස්ස රජතුමා විසින් මිහින්තලා පර්වතයේ ලෙන් හැටඅටක් ඉදිකොට සංඝයාට පූජා කරන ලදි.
(5) අභයගිරි විහාරයේ ප්‍රයෝජනය පිණිස ගජබා රජතුමා විසින් ගාමිණීතිස්ස ජලාශය තනවන ලදි.

**38.** “ලංකාවේ රජු බෞද්ධයකු පමණක් නොව බෝධිසත්ත්වයකු ද විය යුතු ය.” යන ප්‍රකාශය ඇතුළත් වන සෙල්ලිපිය පිහිටුවන ලද්දේ .................................. රජතුමා විසිනි.
(1) නිශ්ශංකමල්ල (2) හතරවන මිහිඳු (3) දෙවන උදය
(4) පළමුවන විජයබාහු (5) මහා පරාක්‍රමබාහු

**39.** ලක්දිව බුදුසසුන පිහිටුවීමෙන් අනතුරුව ශාසනමාමක රජවරුන් විසින් බෞද්ධ ආරාම මෙන් ම පිරිවෙන් ද කරවා සසුනට පූජා කරන ලදි. එම පිරිවෙන් අතුරෙන් 'වියපත් අට ගණ' යන නමින් සම්භාවනාවට පත් මූලායතන අටක් පැවැතිණි. එම මූලායතන අටට අයත් **නො වන්නේ,**
(1) දක්ඛිණ මූලයයි. (2) විල්ගම් මූලයයි.
(3) මහානෙත්තපප්පාසාද මූලයයි. (4) සේලන්තර මූලයයි.
(5) කාලප්පාසාද මූලයයි.

**40.** තාවකාලික පැවිද්ද ථායිලන්තයේ ජනප්‍රිය බෞද්ධ සංස්කෘතිකාංගයකි. සෑම පිරිමියකු ම ස්වකීය ජීවිත කාලය තුළ කිසියම් හෝ කාල පරිච්ඡේදයක් පැවිදි වී සිටීම ජීවිතයේ විවිධ අරමුණු ජය ගැනීමට හේතු වන බව ථායි ජනයාගේ විශ්වාසයයි. පහත සඳහන් වන්නේ තාවකාලික ථායි පැවිද්දේ අරමුණු පිළිබඳ ප්‍රකාශ සතරකි.
*A* - පැවිදි වී සිටීම විවාහයට සුදුසුකමකි.
*B* - රැකියා ලැබීමේ සුදුසුකමකි.
*C* - සුගතිගාමී වීමට කෙටි මගකි.
*D* - බෝධිසත්ත්වයකු වීමට අත්‍යවශ්‍ය වූවකි.
ඉහත ප්‍රකාශ අතුරෙන් ථායි පැවිද්දෙන් අපේක්ෂිත අරමුණු දැක්වීමට වඩාත් ගැළපෙන ප්‍රකාශ දෙක වන්නේ,
(1) *A* සහ *B* ය. (2) *A* සහ *C* ය. (3) *A* සහ *D* ය. (4) *B* සහ *C* ය. (5) *B* සහ *D* ය.

**41.** ථායිලන්ත බුදුසමයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) ක්‍රි.පූ. 329 දී නකොම් පථොම් නගරය ආශ්‍රිත ව ථෙරවාදී බුදුසමය ව්‍යාප්ත විය.
(2) ක්‍රි.ව. 700 දී පලම්භාන් රජුගේ අනුග්‍රහයෙන් මහායාන බුදුසමය ව්‍යාප්ත විය.
(3) ක්‍රි.ව. 11 වන සියවසේදී බුරුම පාලක අනෞරථ රජුගේ අනුග්‍රහයෙන් බුද්ධ ධර්මය ව්‍යාප්ත විය.
(4) ක්‍රි.ව. 1361 දී ශ්‍රී සූර්යවංශ රාම මහාධාර්මික රජුගේ අනුග්‍රහයෙන් ලාංකේය භික්ෂූන් මගින් බුද්ධ ධර්මය ව්‍යාප්ත විය.
(5) ක්‍රි.ව. 7 වන සියවසේදී ද්වාරවතී රාජ්‍යයෙන් චීනයට බුදුසමය ව්‍යාප්ත විය.

**42.** චීනය හා ශ්‍රී ලංකාව අතර ඈත අතීතයේ පටන් ම ආගමික හා සංස්කෘතික සම්බන්ධතා පැවතිණි. එම සම්බන්ධතා තහවුරු කිරීමෙහි ලා ශ්‍රී ලාංකිකයන්ගෙන් ද නොමඳ දායකත්වයක් ලැබුණි. ඒ අනුව චීන බුදුසමයේ ප්‍රගමනයට ශ්‍රී ලාංකේය කාන්තාවන්ගෙන් සිදු වූ මෙහෙය ප්‍රකට වන ප්‍රමුඛ නිදසුනක් වන්නේ,
(1) බෞද්ධ සංකේත හා පූජා වස්තූන් ලාංකේය කාන්තාවන් මගින් ලැබීමයි.
(2) බෞද්ධ වෙහෙර විහාර ගොඩනැංවීමේදී ලාංකේය කාන්තාවන්ගේ දායකත්වය නො මඳව ලැබීමයි.
(3) ත්‍රිපිටක ග්‍රන්ථ පරිවර්තනයේදී ලාංකේය කාන්තාවන්ගේ දායකත්වය ලැබීමයි.
(4) භික්ෂුණී ශාසනය පිහිටුවීමේදී ලාංකේය කාන්තාවන්ගේ දායකත්වය ලැබීමයි.
(5) බුදුදහම හඳුන්වා දීමේදී ලාංකේය කාන්තාවන් පෙරමුණ ගැනීමයි.

**43.** ජපානයට බුදුසමය පැමිණීමෙන් පසු එරට සෑම ක්ෂේත්‍රයක් කෙරෙහි ම බුදුසමයේ ආභාසය ලැබුණි. ඒ අතර බුද්ධ ප්‍රතිමා නිර්මාණයට එරට කලා ක්ෂේත්‍රයේ හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. ජපන් බුද්ධ ප්‍රතිමා අතර භෛෂජ්‍යගුරු, වෛරෝචන හා නරාදයිබුත්සු ප්‍රතිමාවලට සුවිශේෂ තැනක් හිමි වේ. මේ අතුරෙන් භෛෂජ්‍යගුරු බුද්ධ ප්‍රතිමාව පිහිටා ඇත්තේ,
(1) තෝදයිජි විහාරයේ ය. (2) හෝර්යුජි විහාරයේ ය.
(3) හෝකොජි විහාරයේ ය. (4) යකුෂිජි විහාරයේ ය.
(5) මියොසින්ජි විහාරයේ ය.

**44.** ක්‍රි.ව. 710 දී ගෙම්මෙයෝ අධිරාජිණිය විසින් නරා ප්‍රදේශය අගනුවර කර ගැනීමෙන් අනතුරු ව ජපානයේ බුදුසමය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. මෙකල ජපානය තුළ බෞද්ධ සම්ප්‍රදායයන් හයක් ම ව්‍යාප්ත ව පැවැති බව ඓතිහාසික තොරතුරුවලින් පැහැදිලි වේ. මේ අතුරෙන් විනය පදනම් කොටගෙන ව්‍යාප්ත ව පැවැති බෞද්ධ සම්ප්‍රදාය වන්නේ,
(1) කුෂ සම්ප්‍රදායයි. (2) ජෝජිත්සු සම්ප්‍රදායයි.
(3) හොස්සෝ සම්ප්‍රදායයි. (4) සන්රොන් සම්ප්‍රදායයි.
(5) රිත්සු සම්ප්‍රදායයි.

**45.** පුරාවිද්‍යාත්මක සාධක අනුව බුදුරදුන්ගේ රුව මානවාකාරයෙන් නිර්මාණය කරන ලද්දේ ක්‍රිස්තු පූර්ව පළමුවැනි සියවසේ හෝ ක්‍රිස්තුවර්ෂ පළමුවැනි සියවසේ දී ය. බුදුරුව පළමු ව ගන්ධාර දේශයේ නිර්මාණය වූ බවට ද මථුරා දේශයේ නිර්මාණය වූ බවට ද විද්වත් මත පවතී. ඒ අනුව පළමු ව බුදුරුව මථුරාවේදී නිර්මාණය වූ බව ප්‍රකාශ කරන ලද්දේ,
(1) ආනන්ද කුමාරස්වාමි මහතා විසිනි.
(2) පර්සි බ්‍රවුන් මහතා විසිනි.
(3) පුෂේ මහතා විසිනි.
(4) පරණවිතාන මහතා විසිනි.
(5) වින්සන්ට් ස්මිත් මහතා විසිනි.

**46.** ගන්ධාර හා මථුරා බුද්ධ ප්‍රතිමාවල අනන්‍යතා ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

*A* - ස්වාභාවික හිසකෙස්
*B* - ශාක්‍යසිංහ ලීලාව
*C* - කැරලි ගැසුණු ශෛලීගත හිසකෙස්
*D* - අඩවන් දෙනෙත්

ඉහත ප්‍රකාශ අතුරෙන් මථුරා බුද්ධ ප්‍රතිමාවේ අනන්‍යතා ලක්ෂණ **දෙකක්** ඇතුළත් වරණය තෝරන්න.

(1) *A* සහ *B*  (2) *A* සහ *C*  (3) *A* සහ *D*  (4) *B* සහ *C*  (5) *B* සහ *D*

**47.** ප්‍රතිමා කලාවට අනුව ආසන යනු හිඳ ගැනීමට භාවිත ආධාරකය නොව හිඳ ගැනීමේදී දෙපා තබා ගන්නා විලාසයයි. ඒ අනුව ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා අතර භද්‍රාසනය නිරූපණය වන ප්‍රතිමාවක් ලෙස හැඳිනගෙන ඇත්තේ,

(1) තොලුවිල ප්‍රතිමාවයි.
(2) ගල් විහාරයේ විද්‍යාධර ගුහාවේ ප්‍රතිමාවයි.
(3) මහමෙව්නාවේ සමාධි ප්‍රතිමාවයි.
(4) අම්බලන්තොට රිදියගම විහාර භූමියෙන් සොයාගත් ප්‍රතිමාවයි.
(5) පන්කුලිය අශෝකාරාමයේ ප්‍රතිමාවයි.

**48.** පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය අනුව ලක්දිව ප්‍රථම ස්තූපය ලෙස සැලකෙන ථූපාරාමයේ නිදන් කොට ඇතැයි සැලකෙන්නේ බුදුරජාණන් වහන්සේගේ,

(1) වම් අකු ධාතුවයි.  (2) දකුණු අකු ධාතුවයි.
(3) ග්‍රීවා ධාතුවයි.  (4) ලලාට ධාතුවයි.
(5) පටී ධාතුවයි.

**49.** සිංහල සාහිත්‍යයේ විවිධ ක්ෂේත්‍රවලට බෞද්ධ ඉගැන්වීම්වලින් ලැබී ඇති ආලෝකය අතිමහත් ය. ලක්දිව ගීත සාහිත්‍යය ද බෞද්ධ ආභාසයෙන් පෝෂණය වී ඇති බවට කොතෙකුත් නිදසුන් ගෙනහැර දැක්විය හැකි ය. අසිරිමත් බුදුසිරිත, බුද්ධ ධර්මය, ශාසන ඉතිහාසය මෙන් ම ඇතැම්විට සමාජ විචාරය ආදි ක්ෂේත්‍ර ද මෙම බෞද්ධ ගීතවලට තේමා සපයා ඇත. ඒ අනුව උසස් පහත් වශයෙන් සමාජ වර්ගීකරණය කිරීමේ හරසුන් බව ප්‍රකට කරන ගී නිර්මාණයක් ලෙස සැලකිය හැක්කේ පහත කුමන ගීතය ද?

(1) "සොර දෙටුවෙක් කස තැලුම් කකා "......
(2) "අඩුකුලේ කියාලා අසරණයා"......
(3) "කවාලා විළඳ ජාතී ඇති කළත් රන් කුඩුවේ"......
(4) "සන්නාලියනේ සන්නාලියනේ...... කාටද ඇඳුම වියන්නේ "......
(5) "සංසාරේ බවේ දුකා ශ්‍රී සැසි දෙසූ මෙසේ "......

**50.** දඹදෙණි හා කෝට්ටේ යුගවල රචිත බොහෝ ගද්‍ය-පද්‍ය නිර්මාණ බුදුගුණ වර්ණනා කිරීම අරමුණු කොට රචිත බව පැහැදිලි වේ. ඒ අනුව දඹදෙණි යුගයේ රචිත පූජාවලියෙන් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේගේ කුමන ගුණය ද?

(1) සම්මා සම්බුද්ධ ගුණය  (2) පුරිසදම්ම සාරථී ගුණය
(3) අරහං ගුණය.  (4) භගවා ගුණය.
(5) සත්ථාදේවමනුස්සානං ගුණය.

***

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

### අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை- 2019

### නව නිර්දේශය/ புதிய பாடத்திட்டம

විෂයය අංකය / பாட இலக்கம: **45**

විෂයය / பாடம்: **බෞද්ධ ශිෂ්ටාචාරය**

### ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 5 | 11. | 4 | 21. | 3 | 31. | 1 | 41. | 5 |
| 02. | 1 | 12. | 1 | 22. | 4 | 32. | 1 | 42. | 4 |
| 03. | 2 | 13. | 3 | 23. | 3 | 33. | 3 | 43. | 2 |
| 04. | 5 | 14. | 1 | 24. | 2 | 34. | 1 | 44. | 5 |
| 05. | 3 | 15. | 4 | 25. | 5 | 35. | 4 | 45. | 1 |
| 06. | 1 | 16. | 5 | 26. | 3 | 36. | 1 | 46. | 4 |
| 07. | 3 | 17. | 2 | 27. | 4 | 37. | 2 | 47. | 4 |
| 08. | 4 | 18. | 3 | 28. | 4 | 38. | 2 | 48. | 2 |
| 09. | 5 | 19. | 3 | 29. | 2 | 39. | 5 | 49. | 2 |
| 10. | 2 | 20. | 5 | 30. | 5 | 40 | 1 | 50 | 3 |

✪විශේෂ උපදෙස්/விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ஒரு சரியான விடைக்கு ලකුණු02බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50= 100

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

2019.08.06 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ. (**I කොටසේ** එක් අනු ප්‍රශ්නයකට ලකුණු **04** බැගින් ද **II කොටසේ** එක් අනු ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.)

## I කොටස

**1.** (i) වානප්‍රස්ථ ආශ්‍රමයට අයත් කාර්යයන් කෙටියෙන් දක්වන්න.

(ii) මානව සංහතියේ ඒකත්වය තහවුරු කිරීමෙහි ලා බුදුසමය ඉදිරිපත් කරන ජීවවිද්‍යාත්මක සාධක සැකෙවින් පෙන්වා දෙන්න.

(iii) පූරණකස්සප ශාස්තෘවරයාගේ අකිරියවාදය ගෙනහැර දක්වන්න.

(iv) අකිරියවාදය පිළිබඳ බුදුසමයේ ආකල්පය සංක්ෂේපයෙන් ඉදිරිපත් කරන්න.

(v) බුද්ධකාලීන භාරතයේ කෘෂිකාර්මික ජීවන රටාවක් පැවැති බවට සාධක **හතරක්** දක්වන්න.

**2.** (i) ලෝකවිදූ බුදුගුණය පිළිබඳ කෙටි විවරණයක් සපයන්න.

(ii) ප්‍රශ්න විසඳීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් භාවිත චතුර්විධ ක්‍රමවේදය කෙටියෙන් හඳුන්වන්න.

(iii) තාදී බුදුගුණයෙන් ශ්‍රාවකයාට ලැබිය හැකි ආදර්ශයන් සංක්ෂිප්ත ව ඉදිරිපත් කරන්න.

(iv) බුදුරජාණන් වහන්සේ ආගමික සහනශීලිතාව ප්‍රකට කළ අවස්ථා **දෙකක්** විස්තර කරන්න

(v) මහාප්‍රජාපතී ගෝතමිය සතුව පැවැති ගුණාංග **පහක්** ගෙනහැර දක්වන්න.

**3.** (i) "උට්ඨානවතෝ සතිමතො………" යන ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) එම ගාථාවේ අර්ථය නිවැරදි ව ලියන්න.

(iii) පුද්ගල ජීවිතයේ සාර්ථකත්වය උදෙසා එම ඉගැන්වීම ආදර්ශ කොට ගත හැකි අයුරු කෙටියෙන් පහදන්න.

(iv) "සුභාසිතා ච යා වාචා" යන්නට කෙටි විවරණයක් සපයන්න.

(v) අලසබවෙහි ආදීනව පිළිබඳ සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන ඉගැන්වීම් පෙන්වා දෙන්න.

## II කොටස

**4.** (i) රටක ආර්ථික සමෘද්ධිය විෂයයෙහි ලා දේශපාලන මැදිහත්වීම කෙසේ සිදුවිය යුතු දැ'යි බෞද්ධ දේශපාලන මූලධර්ම ඇසුරෙන් විස්තර කරන්න.

(ii) පුද්ගල ස්වාමිත්වය පිළිබඳ බුදුසමයේ ආකල්පය වෙනත් සමකාලීන ආගමික ඉගැන්වීම්වලින් වෙනස්වන අයුරු පැහැදිලි කරන්න.

5. (i) නූතන සමාජය මුහුණ දෙන ප්‍රධාන සමාජ ගැටලු අවම කර ගැනීමට පඤ්චශීල ප්‍රතිපදාවෙන් ලැබිය හැකි පිටිවහල පැහැදිලි කරන්න.

(ii) ගෘහස්ථ ජීවිතයේ සාර්ථකත්වය සඳහා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ මූලධර්ම අදාළ කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

6. (i) භික්ෂු සමාජයේ පාරිශුද්ධිය පිණිස ධර්ම සංගායනාවලින් ලැබුණු පිටිවහල නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(ii) කණිෂ්ක රජු විසින් සිදු කරන ලද ශාසනික මෙහෙය ඓතිහාසික සාධක ඇසුරෙන් ඇගයීමට ලක් කරන්න.

7. (i) ථෙරවාද බුදුසමයේ සුරක්ෂිතතාව පිණිස මහාවිහාරීය භික්ෂූන් විසින් සිදු කරන ලද මෙහෙවර විස්තර කරන්න.

(ii) මියන්මාරයට බුදුසමය හඳුන්වාදීමේ ඓතිහාසික පසුබිම කෙටියෙන් ගෙනහැර දක්වා එරට ජනජීවිතය බුදුසමයෙන් පෝෂණය වූ ආකාරය පැහැදිලි කරන්න.

8. (i) ශ්‍රී ලාංකේය ස්තූප නිර්මාණයේ දී භාරතීය ස්තූප කලාවේ මූලික ආකෘතිය නවීකරණය වූ ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ii) බෞද්ධ සාරධර්ම ජන විඥානයට සම්ප්‍රේෂණය කිරීමෙහි ලා කෝට්ටේ යුගයේ සිංහල පද්‍ය සාහිත්‍ය රචකයන් විසින් ගන්නා ලද උත්සාහය ලෝවැඩ සඟරාව ඇසුරෙන් ඇගයීමට ලක් කරන්න.

***

# 45 - බෞද්ධ ශිෂ්ටාචාරය

## II පත්‍රය

## I කොටස

**01. (i) වානප්‍රස්ථ ආශ්‍රමයට අයත් කාර්යයන් කෙටියෙන් දක්වන්න.**

- තවුස් දම් රැකීම සඳහා වනගත වීම මෙම ආශ්‍රමයේදී සිදු වේ.
- දරු මුණුපුරන් ලැබීමෙන් පසු භාර්යාව සමග හෝ හුදකලා ව වනගත විය යුතු ය.
- කාමභෝගී ජීවිතයෙන් සම්පූර්ණයෙන් ඉවත් විය යුතු ය.
- වනයෙන් සොයා ගන්නා ලද පලවැල ආහාරයට ගනිමින් හෝ පිඬු සිඟා යාමෙන් යැපිය යුතු ය.
- හෝම ගින්න නො නිවා පවත්වාගෙන යා යුතු ය.
- ආගමික අංශයට නැඹුරු ව ආත්මය මුදවා ගැනීමට ක්‍රියා කළ යුතු ය.

**(ලකුණු 04 )**

**01. (ii) මානව සංහතියේ ඒකත්වය තහවුරු කිරීමෙහි ලා බුදුසමය ඉදිරිපත් කරන ජීවවිද්‍යාත්මක සාධක සැකෙවින් පෙන්වා දෙන්න.**

- වාසෙට්ඨ සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ ජීවවිද්‍යාත්මක කරුණු ඉදිරිපත් කරමින් මානව සංහතියේ ඒකත්වය තහවුරු කර ඇති බව.
- වෘක්ෂ, තෘණ ආදියෙහි ඒ ඒ ජාතියට අයත් ලක්ෂණ ඇති බව.
- පක්ෂීන්, සිවුපාවුන්, උරගයන්, මත්ස්‍යයන් යන සතුන් ස්වජාතිමය ලක්ෂණ අනුව බෙදා දැක්විය හැකි බව.
- මනුෂ්‍ය වර්ගයා ස්ව ජාතියට අයත් ලක්ෂණ අනුව වෙන් කළ නො හැකි බව.
  ''යථා ඒතාසු ජාතීසු - ලිංගං ජාතිමයං පුථු
  ඒවං නත්ථි මනුස්සේසු - ලිංගං ජාතිමයං පුථු'' **(මජ්ඣිම නිකාය- වාසෙට්ඨ සූත්‍රය)**
  යම් සේ මේ ජාතීන් කෙරෙහි, ජාතියෙන් හටගත් සටහන් බොහෝ වේ ද මනුෂ්‍යයන් කෙරෙහි එසේ බොහෝ වූ ජාතියෙන් හටගත් සටහන් නො වෙත්. මනුෂ්‍ය වර්ගයා තුළ ඇත්තේ ස්ත්‍රී පුරුෂ ලිංග භේදය පමණි.

**(ලකුණු 04)**

## 01. (iii) පූරණකස්සප ශාස්තෘවරයාගේ අකිරියවාදය ගෙනහැර දක්වන්න.

පූරණකස්සප අකිරියවාදියෙක් ලෙස දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රයෙහි සඳහන් වේ.

- සියතින් කරන්නාට ද, අනුන් ලවා කරවන්නාට ද, අනුන්ගේ අත්පා සිඳින්නාට ද සිඳවන්නාට ද, අනුන් දඬුවමින් පෙළන්නාට ද, පෙළවන්නාට ද පවක් සිදු නො වන බව පූරණකස්සපගේ අකිරියවාදි දර්ශනයේ දක්වා ඇති බව. සමස්ත පෘථිවියේ සියලු ප්‍රාණීන් මරා එක ම මස් ගොඩක් කළ ද ඒ හේතුවෙන් සිදුවන පාපයක් නැතැයි ඉගැන්වූ බව. ගංගා නම් ගඟේ දකුණු කෙළවර දක්වා ගමන් කරමින් හමුවන සියලු ම ප්‍රාණීන් මරමින්, මරවමින්, සිඳවමින්, සිඳවමින් ගමන් කළ ද එයින් සිදුවන පවක් නැතැයි ඉගැන්වූ බව.

  ''කරෝතෝ බෝ මහාරාජ කාරයතෝ ඡින්දතෝ ඡේදාපයතෝ පචතෝ පාචයතෝ... ඛුරපරියන්තේන චේපි චක්කේන යෝ ඉමිස්සා පඨවියා පාණේ ඒකමංසඛලං ඒකමංසපුඤ්ජං කරෙය්‍ය නත්ථි තතෝ නිදානං පාපං නත්ථි පාපස්ස ආගමෝ. දක්ඛිණං චේපි ගංගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තෝ ඝාතෙන්තෝ ඡින්දන්තෝ ඡේදාපෙන්තෝ පචෙන්තෝ පාචෙන්තෝ නත්ථි තතෝ නිදානං පාපං නත්ථි පාපස්ස ආගමෝ...''

- දන් දෙමින්, දන් දෙවමින්, යාග කරමින් කරවමින් ගංගා නම් ගඟේ උතුරු කෙළවර තෙක් ගියේ වී නමුදු පිනක් ලෙස නිදන්ගත වන්නේ හෝ පිනක පැමිණීමක්වත් සිදුවන්නේ නැති බව. දානයෙන්, ඉන්ද්‍රිය දමනයෙන්, සංවරයෙන්, සත්‍ය වචනයෙන් සිදුවන පිනක් නැතැයි උගන්වන බව. පිනක් හෝ පිනක පැමිණීමක්වත් සිදුවන්නේ නැති බව.
  ''උත්තරං චේපි ගංගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තෝ දාපෙන්තෝ යජන්තෝ යජාපෙන්තෝ නත්ථි තතෝ නිදානං පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමෝ. දානේන දමේන සංයමේන සච්චවජ්ජේන නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමෝ...''

**(ලකුණු 04)**

## 01. (iv) අකිරියවාදය පිළිබඳ බුදුසමයේ ආකල්පය සංක්ෂේපයෙන් ඉදිරිපත් කරන්න.

- අකිරියවාදය ප්‍රතික්ෂේප කරන බුදුදහම කම්මවාදී, කිරියවාදී, විරියවාදී, දහමක් ඉදිරිපත් කරන බව.

- බුදුදහම සචේතනික ක්‍රියාවේ වගකීම කරන්නා විසින් ම දැරිය යුතු යැයි උගන්වන බව.
  ''අත්තනාව කතං පාපං අත්තනා සංකිලිස්සති
  අත්තනා අකතං පාපං අත්තනාව විසුජ්ඣති''

- අංගුත්තර නිකායේ නිබ්බේධික සූත්‍රයෙහි
  ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි. චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා''
  ''මහණෙනි මම චේතානව කර්මය යැයි කියමි. සිතින් සිතා කයින්, වචනයෙන්,
  සිතින් කර්ම කරයි.'' යනුවෙන් හිතා මතා තිදොරින් කරනු ලබන ක්‍රියා කර්ම ලෙස දේශනා කොට ඇති බව.

- ලෝභ, දෝස, මෝහ චේතනා පෙරදැරි ව සිදුකරන ක්‍රියා අකුසල ක්‍රියා වන අතර, අලෝභ, අදෝස, අමෝහ චේතනා පෙරදැරි ව සිදු කරනු ලබන ක්‍රියා කුසල ක්‍රියා වන බව.

- සචේතනික ව සිදු කරනු ලබන පින් පව්, කුසල් අකුසල් අදාළ පුද්ගලයාට දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරීයවේදනීය වශයෙන් මෙලොවදී හෝ මතු භවවලදී හෝ විපාක ලබා දීමට ඉදිරිපත් වන බව.

- ප්‍රාණඝාතාදී සියලු දුසිරිත් අසාධු, අකරණීය, පාප, අකුසල ලෙස හඳුන්වා ඒවායින් වැළකෙන ලෙස උපදෙස් දෙන බුදුසමය තමාට මෙරමාට හා උභය පක්ෂයට හිතසුව පිණිස පවතින දානාදී සත්ක්‍රියා සාධු, පුඤ්ඤ, කුසල ලෙස ඉහළින් අගය කරන බව.
- දානය, ඉන්ද්‍රිය දමනය, සීල සංවරය ආදී ක්‍රියා මෙලොව පරලොව ජීවිත සුවපත් කිරීමට පමණක් නොව සාංසාරික දුක් කෙළවර කොට නිවන් පසක් කිරීමට ද ඉවහල් වන මහානිසංසදායක සදාචාරාත්මක සත්ක්‍රියා ලෙස බුදුදහම අගය කරන බව.

- චූල්ලකම්මවිභංග සූත්‍රයට අනුව සත්ත්වයන් විසින් රැස් කරනු ලබන කර්මය නිසා එම සත්ත්වයෝ වෙනස්කම් සහිත ව උපදින බව.
- '' සබ්බේ සත්තා මරිස්සන්ති - මරණන්තම්හි ජීවිතං
  යථා කම්මං ගමිස්සන්ති - පුඤ්ඤපාප ඵලූපගා
  නිරයං පාප කම්මන්තා - පුඤ්ඤ කම්මා ච සුග්ගතිං
  සියලු සත්ත්වයෝ මරණයට පත් වන්නාහ. ජීවිතය මරණයෙන් කෙළවර වේ. මැරෙන සත්ත්වයෝ තම තමන් විසින් කරනු ලැබූ පින් පව් අනුව යන්නාහු, පව්කම් ඇත්තෝ නිරයටත්, පින්කම් ඇත්තෝ සුගතියටත් පැමිණෙන්නාහ.

මෙබඳු කරුණු ඉදිරිපත් කරමින් බුදුදහම අකිරිවාදය ප්‍රතික්ෂේප කරමින් කිරියවාදි දහමක් ඉදිරිපත් කර ඇති බව දැක්විය යුතු ය.

**(ලකුණු 04)**

**01. (v) බුද්ධකාලීන භාරතයේ කෘෂිකාර්මික ජීවන රටාවක් පැවැති බවට සාධක හතරක් දක්වන්න.**

- දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ ''ඛෙත්තානං අධිපතීති ඛො වාසෙට්ඨ ඛත්තියෝ ''යනුවෙන් කෘෂිකර්මය ක්ෂත්‍රිය වර්ණයේ කාර්යයක් බව දක්වා ඇත.

- කෘෂිකර්මාන්තයට අනුග්‍රහ දැක්වීම රජුගේ ප්‍රමුඛ කාර්යයක් බව දීඝනිකායේ කූටදන්ත සූත්‍රයේ දැක්වේ.

- බුද්ධකාලයේ විසූ රජවරුන්ගේ නම් කෘෂි කර්මාන්තයට අදාළ වන වචන ඇසුරෙන් යොදා ඇති බව (සුද්ධෝදන, අමිතෝදන, ධෝතෝදන, මිතෝදන)

- ''වප් මඟුල්'' උත්සවය රජුගේ සහභාගිත්වයෙන් සිදු කළ බව.

- විශාල කෙත්වතු, ධාන්‍ය ගබඩා හිමිකරුවන් බුද්ධකාලීන සමාජයේ සිටුවරුන් වී සිටි බව.

- කෘෂිකර්මාන්තයෙන් යැපෙන පුද්ගලයන්ට අවශ්‍ය පරිභෝජනීය ද්‍රව්‍ය කෘෂි නිෂ්පාදන හුවමාරුවෙන් ලබාගත් බව (භෝග හුවමාරුව)

- සේද මාවත හරහා කෘෂි නිෂ්පාදන ප්‍රවාහනය කළ බව.
- බුද්ධකාලීන භාරතයේ දියුණු වාරිමාර්ග පද්ධතියක් තිබූ බව.
- රෝහිණී නදියේ ජලය සම්බන්ධයෙන් ඇති වූ ප්‍රශ්නය නිරාකරණයට බුදුරජාණන් වහන්සේ මැදිහත් වූ බව.
- කසී භාරද්වාජ වැනි බමුණන් පවා කෘෂිකර්මාන්තයේ යෙදී සිටි බව.
- බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කිරීමේදී කෘෂි උපකරණ හා තදනුබද්ධ අංග උපමා වශයෙන් යොදා ගත් බව.

  ''සද්ධා බීජං තපෝ වුට්ඨී - පඤ්ඤා මේ යුග නංගලං
  හිරි ඊසා මනෝ යොත්තං - සති මේ ඵාල පාචනං''

  **(සුත්ත නිපාතය - කසීභාරද්වාජ සූත්‍රය)**

  ශ්‍රද්ධාව බිජුවට වෙයි. තපස වැසි දහර වෙයි. ප්‍රඥාව විය නගුල් වෙයි. විරිය නගුලිස් වෙයි. සිත විය රැහැන් වෙයි. ස්මෘතිය මාගේ හීවැල හා කෙවිටයි.
- බුදුරජාණන් වහන්සේ මගධ කෙතේ ආකෘතියට අනුව චීවරය සකස් කර ගැනීමට භික්ෂූන් වහන්සේලාට උපදෙස් දී ඇති බව.
- කෘෂිකර්මාන්තය දැහැමි වෘත්තියක් ලෙස බුදුරජාණන් වහන්සේ ව්‍යග්ඝපජ්ජ ආදි බොහෝ සූත්‍රයන්හි හඳුන්වා දී ඇති බව.

**(ලකුණු 04)**

**02. (i) ලෝකවිදූ බුදුගුණය පිළිබඳ කෙටි විවරණයක් සපයන්න.**

- බුදුරජාණන් වහන්සේ, ලෝකය ස්වභාව වශයෙන් ද, ලෝක සමුදය වශයෙන් ද, ලෝක නිරෝධ වශයෙන් ද, ලෝක නිරෝධය පිණිස උපාය වශයෙන් ද (මාර්ග වශයෙන්) යන සියලු ආකාරයෙන් ලෝකය දන්නා බැවින් ද, ලෝකය අවබෝධ කළ බැවින් ද, ලෝකවිදූ නම් වේ.
- තවද සංඛාර ලෝක, සත්ත ලෝක, ඕකාස ලෝක යන තුන් ලොවට අදාළ සියලුම දේ තත්වූ ආකාරයෙන් මැනවින් දැන ඒ පිළිබඳ නො දන්නා ලෝක සත්ත්වයාට නියම ආකාරයෙන් දේශනා කළ බැවින් ද ලෝකවිදූ නම් වේ.
- තුන් ලොව තතු ලෙසට - දැනගෙන නොදත් මෙලොවට
  දෙසුයෙන් නියම කොට - ලෝකවිදූ යැයි කියති මුනිඳුට **(බුදුගුණාලංකාරය)**

**(ලකුණු 04)**

**02. (ii) ප්‍රශ්න විසඳීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් භාවිත චතුර්විධ ක්‍රමවේදය කෙටියෙන් හඳුන්වා දෙන්න.**

බුදුරජාණන් වහන්සේ විසින් තමා වෙත එළඹුණ ගැටලු විසඳන ලද ක්‍රම හතරක් පෙළ දහමේ සඳහන් වේ.

| | | | |
|---|---|---|---|
| 01. | ඒකංස ව්‍යාකරණීය | - | සෘජු පිළිතුරු සැපයීම<br>උදා :- ආලවක සූත්‍රය |
| 02. | විභජ්ජ ව්‍යාකරණීය | - | විශ්ලේෂණාත්මක ව පිළිතුරු දීම<br>උදා :- චූල්ලකම්මවිභංග සූත්‍රය |
| 03. | පටිපුච්ඡා ව්‍යාකරණීය | - | ප්‍රතිප්‍රශ්න විමසා පිළිතුරු ලබා දීම<br>උදා :- චූල්ලසච්චක සූත්‍රය |
| 04. | ඨපනීය | - | ප්‍රශ්න පසෙකින් තැබීම<br>උදා :- චූල්ලමාලුංක්‍යපුත්ත සූත්‍රය |

**(ලකුණු 04)**

**02. (iii) තාදී බුදුගුණයෙන් ශ්‍රාවකයාට ලැබිය හැකි ආදර්ශයන් සංක්ෂිප්ත ව ඉදිරිපත් කරන්න.**

- තාදී බුදුගුණය යනු ලාභ-අලාභ, යස-අයස, ප්‍රසංශා-නින්දා-, සැප-දුක් යන අෂ්ටලෝක ධර්ම හමුවේ නො සැලී ක්‍රියා කිරීමට ඇති හැකියාවයි.
- අටලෝ දහමින් කම්පා නො වීම මංගල කරුණක්බව මහා මංගල සූත්‍රයේ දැක්වේ.
- බුදුරජාණන් වහන්සේ අටලෝ දහම හමුවේ නො සැලී කටයුතු කළ ආකාරය හඳුනා ගත හැකි අවස්ථා සූත්‍ර පිටකයේ හා විනය පිටකයේ කොතෙකුත් හමු වේ.

- අග්ගික භාරද්වාජ, අක්කෝස භාරද්වාජ ආදීන්ගේ දොස් නැගීම් හමුවේ ද, දෙව්දත් සහ ඔහුගේ අනුගාමිකයන්ගේ සතුරුකම් හමුවේ ද චිංචා මානවිකාවගේ චෝදනාව, සුන්දරී පරිබ්‍රාජිකාවගේ ඝාතනය ආදී සිද්ධීන් නිසා ඇති වූ නින්දා අපහාස හමුවේ ද රාජ රාජ මහාමාත්‍යවරුන් ප්‍රමුඛ දහස් ගණන් ජනී ජනයාගේ කීර්ති ප්‍රශංසා හමුවේ ද ජේතවනාරාමය, පූර්වාරාමය ආදී මහා පූජා සත්කාර හා ලාභ හමුවේ ද වේරඤ්ජා වස් කාලය වැනි කටුක වූ දුක් සහගත කාලවලදී ද ඉවසීමෙන් හා උපේක්ෂාවෙන් සියල්ල සම සිතින් විඳ දරා ගත් බව.
- ගිහි පැවිදි සියලු දෙනාට සමාජය තුළ විවිධ ගැටලු ඇති වීම ස්වාභාවික බැවින් ඒවාට මුහුණ දීමේදී අකම්පිත ව සිහි නුවණින් යථාර්ථය පිළිබඳ අවධිකමකින් කටයුතු කිරීමට බුද්ධ ශ්‍රාවකයාට මෙම විශිෂ්ට තාදී බුදු ගුණයෙන් ආදර්ශ ලබා ගත හැකි බව.
- ඉවසීම, සංවර ව කටයුතු කිරීම, නො බියව කටයුතු කිරීම, යථාර්ථයෙන් පලා නො යාම, උපේක්ෂා සහගත වීම, මානසික බිඳ වැටීම වලක්වා ගැනීම වැනි ධනාත්මක ආකල්ප තාදී ගුණය ප්‍රගුණ කිරීමෙන් සංවර්ධනය වනබව.

**(ලකුණු 04)**

## 02. (iv) බුදුරජාණන් වහන්සේ ආගමික සහනශීලිතාව ප්‍රකට කළ අවස්ථා දෙකක් විස්තර කරන්න.

- පොට්ඨපාද සූත්‍රයේ දැක්වෙන පරිදි පොට්ඨපාද පිරිවැජියා ඇත වඩින බුදුරජාණන් වහන්සේ දැක උන්වහන්සේගේ පැමිණීම අපේක්ෂාවෙන් තුන්දහසක් තරම් වූ තම පිරිවැජි පිරිස අමතා,
''භවත්හු නිහඬ වෙත්වා. ඒ මහණ ගොයුම්හු එයි. ඒ ආයුෂ්මත් තෙම නිහඬබව කැමැත්තේය. නිහඬබැව්හි ගුණ කියන සුළු ය.'' යනුවෙන් ප්‍රකාශ කර ඇත.
- මහා සකුළුදායී සූත්‍රයෙහි සඳහන් වන පරිදි සකුළුදායී පිරිවැජියා තම පරිබ්‍රාජක අසපුවට වැඩි බුදුරජාණන් වහ්නසේ ඉතා ප්‍රසාදයෙන්, සුහද ව පිළිගෙන
'' ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙහි වඩින සේක්වා. භාග්‍යවතුන් වහන්සේගේ වැඩීම යහපති. භාග්‍යවතුන් වහන්සේ බොහෝ කලකින් මෙහි වැඩම කළහ. භාග්‍යවතුන් වහන්සේ වැඩ හිඳින සේක්වා...'' යනුවෙන් ප්‍රකාශ කොට ඇත.

- උදුම්බරික සීහනාද සූත්‍රයේ අන්තර්ගත නිග්‍රෝධ පිරිවැජියා අමතා
''නිග්‍රෝධය, නුඹට මෙබඳු අදහසක් වන්නේය. අප අතවැස්සන් කරනු කැමැත්තෙන් ශ්‍රමණ ගෞතම තෙමේ මෙසේ කියන්නේය, යන අදහසයි. නිග්‍රෝධය මේ කාරණය එසේ නො දතයුතු. යමෙක් ඔබගේ ගුරුවේ ද ඔහු ම ඔබගේ ගුරු වේවා... හිත කෙලෙසන්නා වූ නැවත ඉපදීම ඇති කරන්නා වූ දැවීම් සහිත වූ දුක් විපාක ඇත්තා වූ මත්තෙහි ජාති, ජරා, මරණ උපදවන්නා වූ යම් අකුශල ධර්ම කෙනෙක් වෙත් ද ඔවුන්ගේ දුරු කිරීම පිණිස ධර්මය දේශනා කරමි.'' යනුවෙන් දේශනා කොට ඇත.

- උපාලි සූත්‍රයේදී උපාලි ගෘහපති අමතා කරන ලද ප්‍රකාශයෙන් ද ආගමික සහනශීලීතාව ප්‍රකට වේ. ජෛන භක්තික උපාලි ගෘහපති වාදයක් සඳහා බුදුරජාණන් වහන්සේ වෙත එළඹ වාදයෙන් පැරදී උන්වහන්සේ පිළිබඳ ප්‍රසාදයෙන් තමා තෙරුවන් සරණ ගිය උපාසකයෙකු කොට දරන්නැයි ඉල්ලූ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ඉක්මන් තීරණ නො ගෙන තවදුරටත් සිතා බලන ලෙසයි. ඉන් තවදුරටත් පැහැදුණු උපාලි ගෘහපතිට නැවතත් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ පෙර ශාස්තෘවරයාට කළ පුද සත්කාර එලෙසට ම පවත්වා ගෙන යන ලෙසයි. ඒ අනුව බෞද්ධයෙකු වුව ද අන්‍යාගමිකයින්ට ගරු කිරීම හා දානාදියෙන් සංග්‍රහ කිරීම බුදුසමය අගයන බව උපාලි සූත්‍රයෙන් පැහැදිලි වේ.
- මහාවග්ග පාළියට අනුව සීහ සේනාධිපතියා හා බුදුරජාණන් අතර සිදු වූ සාකච්ඡාවෙන් අනතුරු ව සීහ සේනාපතියා බුදුන් සරණ යාමට අවසර ඉල්ලූ විට බුදුරජාණන් වහන්සේ විසින් සිදු කරන ලද ප්‍රකාශයෙන් ද උන්වහන්සේ සතු ආගමික සහනශීලීතාව ප්‍රකට වේ.

  '' සීහය ඔබ වැනි කෙනෙකු එසේ කිරීම සුදුසු නොවේ. නැවත නැවතත් සිතා බලා සරණ යාම ඔබ වැනි කෙනෙකුට සුදුසුය.''

- තව ද බුදුරජාණන් වහන්සේ සමකාලීන අන්‍යාගමික ශාස්තෘන්ගේ පවා බුහුමනට පාත්‍ර වූයේ උන්වහන්සේ සතු ආගමික සහනශීලීතාව හේතුවෙන් බව සෝණදණ්ඩ හා චංකි වැනි සූත්‍රවලින් ද හෙළි වේ.
- දානය පිළිබඳ දක්වා ඇති බොහෝ තැන්වලදී '' මහණ බමුණන්ට දන් දීම'' යනුවෙන් සඳහන් ව ඇති බැවින් තත්කාලීන සියලු ආගමික පූජනීයයන් අරමුණු කොට ඇති බව පැහැදිලි ය.

**(ලකුණු 04)**

### 02. (v) මහාප්‍රජාපතී ගෝතමිය සතුව පැවැති ගුණාංග පහක් ගෙන හැර දක්වන්න.

මහා ප්‍රජාපතී ගෝතමිය සතුව පැවැති ගුණාංග

- මවු ගුණය
  - සිදුහත් කුමරුට ද, නන්ද කුමරුට හා නන්දා කුමරියට ද එකම ආකාරයේ දරු සෙනෙහසක් පෑ ඇය රාහුල කුමරුට දක්වූයේ ද එවැනි ම වූ මවු සෙනෙහසකි.
  - අගනා සිවුරු පිළි දෙකක් සියතින්ම නිමවා බුදුරජාණන් වහන්සේට පූජා කිරීමට ඉදිරිපත් වූයේ නොමියෙන මවුවත් කමින් හා අප්‍රමාණ බුද්ධ ගෞරවයෙන් යුතුවය.

- චාම්බව
  - ක්ෂත්‍රිය කුලයේ ප්‍රමබතම කාන්තාවක් වුවද හැම විටම චාම් සරල ජීවිතයක් ගත කිරීම.
- පරිත්‍යාගශීලීබව
  - මහාමායා දේවිය කලුරිය කළ පසු සුද්ධෝදන රජුගේ අග බිසව් තනතුර ලැබ කටයුතු කිරීම.
  - සියලු රජ සම්පත් අත්හැර කාන්තාවන්ට පැවිද්ද ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ඉදිරිපත් වී ක්‍රියා කිරීම.
- උත්සාහය හා අධිෂ්ඨානය
  - කපිලවස්තුවේදී බුදුරජාණන් වහන්සේගෙන් තෙවරක් පැවිද්ද ඉල්ලා සිටිමුත් එය ප්‍රතික්ෂේප වුව ද ඉන් නොනැවතී පාගමනින් ම ශාක්‍ය කාන්තාවන් 500 දෙනෙකු සමග විශාලා මහනුවර කූටාගාර ශාලාව වෙත පැමිණ ආනන්ද හිමියන්ගේ ද උපකාර ඇතිව පැවිදි උපසම්පදාව ලබා ගැනීමට උත්සුක වීම.
- නිහතමානීබව
  - චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අගතනතුර ලැබුව ද ඇය නිහතමානීව කටයුතු කිරීම.
  - පිරිනිවන් පෑමට අවසර ගැනීම සඳහා පැමිණි අවස්ථාවේදී වරදක් වූවා නම් සමාවන්නැ යි බුදුරදුන්ගෙන් ඉල්ලීම.
  - අෂ්ට ගරුධර්ම ගෞරවයෙන් පිළිගෙන ක්‍රියාවට නැංවීම.
- ඉවසීම
  - නන්ද හා රාහුල කුමාරවරුන් පැවිදි වීම හා සුද්ධෝදන රජතුමාගේ අභාවය නිසා හුදකලා වුව ද එම සියල්ල ඉවසීමෙන් දරා සිටීම.

**(ලකුණු 04)**

**03. (i)"උට්ඨානවතෝ සතිමතො..."යන ගාථාව සම්පූර්ණ කරන්න.**

උට්ඨානවතෝ සතිමතෝ
සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්ස ච ධම්මජීවිනෝ
අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති

**(ලකුණු 04)**

**03. (ii) එම ගාථාවේ අර්ථය නිවැරදි ව ලියන්න.**

පසු නො බසිනා වීර්යය ඇති, මනාවූ සිහි ඇති, නිවැරදි දේ කරන, විමසා බලා කටයුතු කරන, තැන්පත්, දැහැමින් දිවි පවත්වන, නො පමා පුද්ගලයාගේ යසස හෙවත් කීර්තිය මනාව වැඩේ.

**(ලකුණු 04)**

**03. (iii) පුද්ගල ජීවිතයේ සාර්ථකත්වය උදෙසා එම ඉගැන්වීම ආදර්ශ කොට ගත හැකි අයුරු කෙටියෙන් පහදන්න.**

- උත්සාහය නැති තැනැත්තා කුසීත ව කටයුතු කරන අතර, දියුණුවට පත් නොවේ.
- ඔහු කුමක් හෝ හේතුවක් ඉදිරිපත් කොට වැඩ කල් දමයි. (අතිසීතං, අතිඋණ්හං....)
- ඉහත ගාථාවෙන් ඉදිරිපත් කොට ඇති

  උත්සාහය,

  එළඹි සිටි සිහිය,

  නිවැරදි දේ පමණක් කිරීම,

  විමසා බලා කටයුතු කිරීම,

  සංයමය,

  දැහැමි ජීවන පිළවෙත,

  අප්‍රමාදී බව

යන සියලු කරුණු පුද්ගලයකුගේ ලෞකික ලෝකෝත්තර දියුණුවට හේතු වන ධනාත්මක ඉගැන්වීම් වේ.

**(ලකුණු 04)**

**03. (iv)''සුභාසිතා ච යා වාචා'' යන්නට කෙටි විවරණයක් සපයන්න.**

- මහාමංගල සූත්‍රයෙහි සඳහන් මංගල කරුණක් වන බව.
- "සුභාසිතා ච යා වාචා" යනු යහපත් වචන කතා කිරීමයි.
- බොරු කීම, කේලාම් කීම, හිස් වචන කීම, පරුෂ වචන කීම යන වචනයෙන් වන වැරදිවලින් වැළකී, යහපත් වචන කතා කිරීම.
- අංගුත්තර නිකායේ තික නිපාතයට අනුව වචන කථා කිරීම, ගුථ භාණි, පුප්ඵ භාණි, මධු භාණි යනුවෙන් ත්‍රිවිධ වේ. ගුථභාණි යනු දුගඳ හමන පිළිකුල් වදන් කීමයි. පුප්ඵ භාණි යනු මල් මෙන් සුවඳ හමන ප්‍රිය වචන කීමයි. මධු භාණි යනු මී පැණි බඳු මිහිරි වදන් කීමයි.

- තමා විසින් කියන ලද වදන් පිළිබඳ පසු විපරම් කිරීමේදී "ඉතා හොඳ ප්‍රිය වචනම බිණුවෙමි" යැයි සතුටු විය හැකි වචනයෙන් අන්‍යයන්ට සංග්‍රහ කළ යුතුබව, "පියවාචමෙව භාසෙය්‍ය යා වාචා පතිනන්දිතා"
- ශිෂ්ට වූත්, ප්‍රිය මනාප වූත්, ප්‍රේමණීය වූත්, කණට මිහිරි වූත් හදයංගම වූත් වචනය ම භාවිත කළ යුතු ය.
- බුදුරදුන් කෙරෙහි අමනාපයෙන් කටයුතු කළ අය ද වාද කොට පරදවමි' යි වාගාඩම්බරයෙන් පැමිණි තැනැත්තන් ද අන්‍යාගමික නායකයන් ද මිසදිටුවන් ආදී බොහෝ අය ද බුදුරදුන්ගේ කර්ණ රසායන මිහිරි වදන් ඇසීමෙන් දමනය වූ බවට උදාහරණ ත්‍රිපිටක සාහිත්‍යයෙන් හමුවේ.

**(ලකුණු 04)**

## 03. (v) අලසබවෙහි ආදීනව පිළිබඳ සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන ඉගැන්වීම් පෙන්වා දෙන්න.

සිගාලෝවාද සූත්‍රයෙහි අලසකමේ ආදීනව හයක් දක්වා ඇත.

01. ඉතා සීත යැයි කටයුතු අතපසු කරයි.
02. ඉතා උෂ්ණ යැයි කටයුතු අතපසු කරයි.
03. ඉතා සවස් කාලය යැයි වැඩ නොකරයි.
04. ඉතා උදෑසන යැයි වැඩ නොකරයි.
05. ඉතා බඩගිනි යැයි වැඩ නොකරයි.
06. ඉතා වැඩියෙන් ආහාර ගත්තා යැයි වැඩ නොකරයි.

**(ලකුණු 04)**

# II කොටස

## 04. (i) රටක ආර්ථික සමෘද්ධිය විෂයයෙහි ලා දේශපාලන මැදිහත්වීම කෙසේ සිදුවිය යුතු දැයි බෞද්ධ දේශපාලන මූලධර්ම ඇසුරෙන් විස්තර කරන්න.

- රටක ආර්ථික සමෘද්ධිය සැලසීම දේශපාලකයන්ගේ ප්‍රධානතම වගකීමකි.
- බෞද්ධ දේශපාලන මූලධර්ම වන
    * පංචසීල ප්‍රතිපදාව
    * දස රාජ ධර්ම
    * සතර අගතියෙන් වෙන්වීම
    * දස සක්විති වත්

* සතර සංග්‍රහ වස්තු
* කූටදන්ත සූත්‍රයේ දැක්වෙන ජනතාවගේ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් පාලකයා විසින් ඉටු කළ යුතු කාර්යභාරයන්
* අග්ගඤ්ඤ සූත්‍රයේ විස්තර අනුව පාලකයාගේ කාර්යභාරය

මේ ආදී බෞද්ධ දේශපාලන මූලධර්මවල ඇතුළත් ආර්ථික සංවර්ධනයට අදාළ ඉගැන්වීම් විචාරාත්මක ව දැක්වීම අවශ්‍ය වේ.

**(ලකුණු 10)**

**04. (ii) පුද්ගල ස්වාමිත්වය පිළිබඳ බුදුසමයේ ආකල්පය වෙනත් සමකාලීන ආගමික ඉගැන්වීම්වලින් වෙනස්වන අයුරු පැහැදිලි කරන්න.**

- පුද්ගල ස්වාමිත්වය යනු තමාට තමා හැර වෙනත් ස්වාමියකු හෝ පාලනය කරන අදෘශ්‍යමාන බලයක් හෝ නො පවතින බව පිළිගැනීම.

- බුද්ධකාලීන භාරතයේ මහා බ්‍රහ්ම, මහා පුරුෂ, පරමේශ්වර වැනි ඊශ්වර නිර්මාණ සංකල්ප හා ජගදාත්ම, පරමාත්ම, විශ්ව ආත්ම වැනි පාරභෞතික සංකල්ප ප්‍රාමාණිකත්වයෙන් ගත් මහණ බමුණන් විසූබවත්, ඔවුන් තුළින් පුද්ගල ස්වාමිත්වය ප්‍රතික්ෂේප වූ බවත් පැහැදිලි වීම.

- ඊශ්වර නිර්මාණවාදී ඉගැන්වීම් අනුව සර්වබලධාරී ඊශ්වරයකු විසින් සත්ත්වයා හා ලෝකය ම පාලනය කරනු ලබන බව පිළිගැනීම නිසා පුද්ගල ස්වාමිත්වය අහිමි වීම.

- පුබ්බේකතහේතුවාදය හා අහේතු අප්පච්චයවාදය, නියතිවාදය ආදී ඉගැන්වීම් මගින් පුද්ගල ස්වාධීනත්වයට හානි සිදු වීම.
- බෞද්ධ ඉගැන්වීම් අනුව පුද්ගලයා පාලනය කරනු ලබන බාහිර බලවේග ඇති බව නො පිළිගැනීම.

- තම කැමැත්තට අනුව හොඳ-නරක තමා විසින් තීරණය කොට ක්‍රියා කළහැකි වීම.

- තමා විසින් සිතාමතා කරනු ලබන හොඳ හෝ නරක ක්‍රියාවල වගකීම තමා වෙත පැවරෙන බව වටහා ගැනීම.

- බුදුදහමට අනුව ලොව වසන බුද්ධිමත් සත්ත්වයා වූ මිනිසාට ස්වාධීන ව විශ්වය අවබෝධ කර ගත හැකිබව අවධාරණය කිරීම.

- සදාචාර සම්පන්න ජීවිතයක් ගත කරන මිනිසාට දෙවියන් පවා නමස්කාර කරනබව
  යෙ ගහට්ඨා පුඤ්ඤකරා..........

- තමාට පිහිට තමාම ය. තමාට වෙන කිසිවකුගේ පිහිටක් නැත. එහෙයින් තමාගේ ගැලවුම්කාරයා ද තමා ම ය. (අත්තාහි අත්තනෝ නාථෝ - කො හි නාථෝ පරෝසියා)

- මිනිසා පිරිසිදු වන්නේත් කිළිටි වන්නේත් තමාගේ ම ක්‍රියාකලාපය අනුව බව බුදුදහම අවධාරණය කර තිබේ.
(සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ)

- තමාම තමාට ආලෝකයක් කොට ගන්න. තමාම සරණකොට ගන්න. බාහිර සරණක් නැත.

  අත්තදීපා විහරථ භික්ඛවේ අත්ත සරණා අනඤ්ඤ සරණා

**(ලකුණු 10)**

## 05. (i) නූතන සමාජය මුහුණ දෙන ප්‍රධාන සමාජ ගැටලූ අවම කර ගැනීමට පඤ්චශීල ප්‍රතිපදාවෙන් ලැබිය හැකි පිටිවහල පැහැදිලි කරන්න.

බෞද්ධයාගේ නිත්‍ය ශීලය ලෙස සලකන පඤ්චසීල ප්‍රතිපදාව ජාති, ආගම්, කුල, භේදයකින් තොර ව පුද්ගල හා සමාජ අභිවෘද්ධියට මෙන් ම සමාජ ගැටලු අවමකර ගැනීමට ඉවහල් වන ආචාර ධර්ම පද්ධතියකි. එහි විරති පක්‍ෂය සපිරීමෙන් ආධ්‍යාත්මික කුසල ශක්තිය වැඩෙන අතර සමාදාන පක්‍ෂය අනුගමනය කිරීමෙන් යුතුකම් ඉටු කරන සමාජයේ සියලු දෙනා කෙරෙහි බැඳුණු සාමකාමී සමාජයක් බිහි වේ.

- ප්‍රාණඝාතයෙන් වැලකීමෙන් අභයදානය අගය කරන සියලු සතුන්ට දයාවන්ත වන තමාගේ මෙන් ම මෙරමාගේ ජීවත් වීමේ අයිතිය සුරකින සුහද සමාජයක් බිහි වේ.

- අදත්තාදානයෙන් වැලකීමෙන් තමාගේ දේපළ හා මෙරමාගේ දේපළ සුරක්ෂිත වන අතර වංචාව, සොරකම, අල්ලස, පොදු සම්පත් අවභාවිත නො කරන සංවර්ධිත සමාජයක් ඇති වේ.

- කාම මිථ්‍යාචාරයෙන් වැලකීමෙන් තමාගේ මෙන් ම අනුන්ගේ පවුල් ජීවිත සුරක්ෂිත වන අතර බාලාපචාර, ස්ත්‍රී දූෂණ, ගණිකාවෘත්තිය වැනි දුසිරිත්වලින් තොර කාන්තා ගෞරවය සුරකින සමාජයක් ගොඩ නැගේ.

- මුසාවාදයෙන් වෙන් වීමෙන් සමාජය තුළ සියලු දෙනාට සත්‍ය දැන ගැනීමට හා වංචනියකයන්ට නො රැවටී විශ්වසනීය පුද්ගලයන්ගෙන් හෙබි සමාජයක ජීවත් වීමට වාසනාව උදාවේ.

- සුරාව - මත්ද්‍රව්‍ය, දුම්වැටි භාවිතය බොහෝ ගැටුම් හා සමාජ අසහනකාරී තත්ත්වයන් නිර්මාණය කරයි. ඉන් වැලකීමෙන් මානසික සහනයෙන් හා තැන්පත් මනසකින් යුතු නීති විරෝධී ක්‍රියා නො කරන මිනිසුන්ගෙන් හෙබි සාමකාමී සමාජ වටපිටවාවක් ගොඩ නැගේ.

- පඤ්චසීල ප්‍රතිපදාව උපයෝගී කර ගැනීමෙන් පුද්ගල හා සමාජ අභිවෘද්ධිය සැලසෙන අතර එහි විරති පක්ෂය වර්ධනය කර ගැනීමෙන් ආධ්‍යාත්මික කුසල ශක්තිය වැඩෙන අයුරුත් චාරිත්‍ර පක්ෂය සපිරීමෙන් සියලු සමාජ කොටස්වලට නිසි යුතුකම් ඉටු කරන පුණ්‍යමය ශක්තිය දියුණු කර ගත් ශ්‍රද්ධා බුද්ධි සම්පන්න සාමාජිකයන්ගෙන් හෙබි අභිවෘද්ධිදායක යහපත් සමාජයක් බිහි කර ගත හැකි අයුරුත් පැහැදිලි කිරීම ප්‍රමාණවත් ය.

(ලකුණු 10 )

**5. (ii) ගෘහස්ථ ජීවිතයේ සාර්ථකත්වය සඳහා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ මූලධර්ම අදාළ කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.**

- ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සමජීවිකතාව ලෙස දක්වා ඇත්තේ අයවැය සම ව පවත්වා ගැනීමයි.

  "මේ ලෝකයෙහි කුල පුත්‍රයෙක් භෝගයන්ගේ අය ද වැය ද දැන ඉතා වැඩිත් නො කොට ඉතා අඩුත් නො කොට සමව දිවි ගෙවයි ද මෙසේ මාගේ අය, වැය ඉක්මවා සිටියි. මෙසේ මාගේ වැය, අය ඉක්මවා නො සිටි," යනුවෙන් සලකා කටයුතු කිරීම සමජීවිකතාවයි.

තරාදියක් ගෙන කිරන පුද්ගලයෙකු මෙපමණින් එය උස් පහත් වේයැයි දන්නා සේ තමා උපයන ධනය වැය කිරීමේදී කෙසේ අයවැය කළමනාකරණය කර ගන්නේ ද යන්න දත යුතු ය.

- සිගාලෝවාද සූත්‍රයට අනුව උපයන ධන සම්පත් කළමනාකරණය කර ගැනීම මෙසේ ය.

  "ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය - ද්වීහි කම්මං පයෝජයේ

  චතුත්ථං ච නිධාපෙය්‍ය - ආපදාසු භවිස්සති"

ආදායම කොටස් හතරකට බෙදා ඉන් එක් කොටසක් පරිභෝජනය සඳහා ද කොටස් දෙකක් ආයෝජනය සඳහා ද ඉතිරි කොටස ආපදාවකදී ගැනීමට සුරක්ෂිත ව තැබීමට ද උපදෙස් දී ඇත.

- සම්පත් කළමනාකරණය පිළිබඳ විනය පිටකයෙන් හමුවන ඉගැන්වීම් මෙසේ ය.

මහාවග්ග පාළියේ වත්තක්ඛන්ධකයේ දැක්වෙන ආරාමික ජීවිතය තුළ අනුගමනය කළයුතු පිළිවෙත් තුළින් සම්පත් කළමනාකරණය කරන අයුරු අවධාරණය කර තිබේ.

ආගන්තුකවත, ආවාසිකවත, පිණ්ඩචාරිකවත, ආරඤ්ඤිකවත, සේනාසනවත, ජන්තාඝරවත, වච්චකුටිකවත ආදිවූ වත් ආගමික ජීවිතය තුළ අනුගමනය කළයුතු පිළිවෙත් රැසකි.

- ආරාමික සම්පත් කළමනාකරණය සඳහා තනතුරු හඳුන්වාදී තිබේ.

උදා:- සේනාසන ගාහාපක, භත්තුත්දේසක, භාණ්ඩාගාරික, චීවර පටිග්ගාහක

- ආනන්ද හිමියන්ට සිවුරු පිණිස සළු 500 ක් ලැබුණු අවස්ථාවේ කොසොල්රජු සමග කළ සංවාදය මෙසේ ය.

මෙහිදී කොසොල් රජුට පිළිවදන් දෙන ආනන්ද හිමි නව සිවුරු පිරිකර පරිභෝජනයට ගන්නා විට පාවිච්චි කළ සිවුරු පොරෝනා ලෙසත්, පොරෝනා ඇඳ ඇතිරිලි ලෙසත් ඇඳ ඇතිරිලි බුමුතුරුණු ලෙසත්, බුමුතුරුණු මැටි සමඟ මිශ්‍ර කොට බිත්ති සැකසීමට ගන්නා බවත් පැහැදිලි කර ඇත.

- සම්පත් නාස්තියෙන් තොර ව උපරිම ප්‍රයෝජන පිණිස යෙදවිය යුතු බව කූල සූත්‍රයෙන් පැහැදිලි කෙරේ.

1. නැසුණු සම්පත් උපයා තැබිය යුතු ය.

2. දිරා විනාශ වන සම්පත් ප්‍රතිසංස්කරණය කළ යුතු ය.

3. අයවැය ප්‍රමාණය දැනගෙන පරිභෝජනය කළ යුතු ය.

4. සිල්වත් වූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු අයවැය කළමනාකරණ කළ යුතු ය.

- ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ආරක්ඛ සම්පදාව යටතේ උපයාගත් සම්පත් ආරක්ෂා කර ගත යුතු යැයි අවධාරණය කොට ඇත.

- පරාභව සූත්‍රයේ සඳහන් පිරිහීමේ දොරටුවලින් ඉවත්ව කටයුතු කිරීමෙන් සම්පත් මැනවින් කළමනාකරණය කර ගත හැකි ය.

- ගාමිණි සංයුත්තයේ රාසිය සූත්‍රයේ සඳහන් කරුණු අතරින් පරිත්‍යාග කිරීම හා ගිජුකමින් තොර ව පරිහරණය කිරීම යන කරුණු වැදගත් වේ.

- සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇති භෝග විනාශමුඛවලින් මිදීම වැදගත් ය.
    1. මත්පැන් බීම
    2. අවේලාවේ වීථි සංචාරය
    3. සමජ්ජාභිචරණය
    4. දූ කෙළියෙහි යෙදීම
    5. පාපමිත්‍ර සේවනය
    6. අලසකම
- පත්තකම්ම සූත්‍රයට අනුව උපයන ධනය, තමාගේ, මවුපියන්ගේ, අඹුදරුවන්ගේ, දැසි දස්කම් කරුවන්ගේ සැපය, පිනවීම හා පරිහරණය උදෙසා යෙදවිය යුතු අතර මහණ බමුණන්ට දන් දීම පිණිස ද යෙදවිය යුතුය.
- ධනය පරිභෝජනය කළ යුත්තේ මනා කළමනාකාරිත්වයෙන් බව බෞද්ධ ඉගැන්වීම වන අතර, එහි ලා උදුම්බරඛාදික හෙවත් අධිපරිභෝජනයත් අජද්ධුමාරික හෙවත් මසුරු කමත් දුරැලිය යුතු බව බෞද්ධ ඉගැන්වීමයි.
- කෝසල සංයුත්තයේ පඨම හා දුතිය අපුත්තක සූත්‍රයන්හි ඇතුළත් ඉගැන්වීම් අනුව අමනුෂ්‍යාධිගෘහිත පොකුණක ඇති පිරිසිදු ජලය පරිභෝග නො කිරීමෙන් විනාශ වී යන්නේ යම් සේ ද අසත්පුරුෂයා ධනය ලැබ තමනුත් පරිභෝග නො කොට අනුන්ටත් නොදී ගොඩ ගසා තබා මිය යයි. අමනුෂ්‍යාධිගෘහිත නොවූ විලක ඇති පිරිසිදු ජලය බොහෝ ජනයා විසින් රිසි සේ පරිභෝග කරනු ලබන්නේ යම් සේ ද එසේ ම සත්පුරුෂයා ඉපයූ ධනයෙන් තමා ද තම අඹුදරුවන් හා දෙමාපියන් ද හිත මිතුරන් ද සේවක ජනයා ද පිනවා මහණ බමුණන් විෂයයෙහි දක්ෂිණාව ද පිහිටවනු ලැබේ. මරණින් මතු සුගතියට ද පැමිණේ.
- අවිධිමත් ගබඩාකරණයෙන් හා අනිසි කළමනාකරණයෙන් තොරවීම වැදගත් ය.

  මෙවැනි ඉගැන්වීම් ඇසුරින් පිළිතුර සකස් ව තිබිය යුතු ය.

**(ලකුණු 10)**

**06. (i) භික්ෂු සමාජයේ පාරිශුද්ධිය පිණිස ධර්ම සංගායනාවලින් ලැබුණු පිටිවහල නිදසුන් මගින් පැහැදිලි කරන්න.**

- ප්‍රථම සංගායනාව පැවැත්වීම පිණිස විවිධ හේතු සාධක බල පෑබව පැහැදිලි කරුණකි. එහෙත් ඊට ආසන්නම හේතුව වූයේ සුභද්‍ර භික්ෂුව විසින් කරන ලද නොහික්මුණු ලාමක ප්‍රකාශය බව ප්‍රකටය.
"අලං ආවුසො මා සොචිත්ථ මා පරිදෙවිත්ථ, සුමුත්තා මයං තෙන මහා සමණෙන. උපද්දුතාච මයං හෝම ඉදං වො කප්පති ඉදං වො න කප්පතීති ඉදානි පන මයං යං ඉච්ඡිස්සාම තං කරිස්සාම යං න ඉච්ඡිස්සාම න තං කරිස්සාම"

- මෙම ප්‍රකාශය හුදකලා වූ භික්ෂුවකගේ ප්‍රකාශයක් ලෙස නොසැලකෙන අතර, මෙමගින් තත් කාලීන භික්ෂු සමාජයේ පැවති බරපතල අර්බුදකාරී තත්ත්වයක් පිළිබිඹු කෙරේ.

- ධර්ම විනය එක්රැස් කර සංගායනා කොට ඒවා කොටස් වශයෙන් වර්ගීකරණය කර භාණක පරම්පරාමගින් ධර්ම විනය බුදුරදුන් දේශනා කළ අයුරින්ම පවත්වාගෙන යාමට තීරණය කොට ක්‍රියාත්මක කිරීමෙන් අධර්මවාදී භික්ෂූන්ගේ ක්‍රියාකාරකම් යටපත් විය. ධර්මවිනයට අධර්මවාදී මති මතාන්තර එකතුවීමට ඉඩ නොතැබීමෙන් භික්ෂු සමාජයේ චිරපැවැත්ම හා පාරිශුද්ධිය තහවුරු විය.

- සංඝයා කැමැතිනම් ඛුද්දානුඛුද්දක ශික්ෂාපද සමූහනයට පරිනිබ්බාණ සූත්‍රයේදී බුදුරදුන් විසින් දෙන ලද අවසරය ක්‍රියාත්මක නො කොට, පනවන ලද ශික්‍ෂාපද ඒ අයුරින්ම ආරක්ෂා කොට පවත්වාගෙන යාමට තීරණය කිරීම මගින් භික්ෂු සමාජය තුළ පැවැති ශික්‍ෂණය හා පිරිසිදුබව ඒ අයුරින්ම පවත්වා ගැනීම භික්ෂු සමාජයේ චිරපැවැත්මට බෙහෙවින් ඉවහල් විය.

- ආනන්ද හිමියන් වෙත එල්ලවී තිබූ චෝදනා විභාග කිරීම ද භික්ෂු විනයට අදාළව පළමු සංගීතියේදී සිදු වූ ඉතා වැදගත් කටයුත්තක් වූ අතර, බුදුසසුන තුළ භික්ෂුවක විසින් විනයානුකූල ව ක්‍රියා කළයුතු ආකාරයත්, විනය විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් අධිකරණ කටයුතු සිදුවන ආකාරයත් එමගින් අවධාරණය කරන ලද අතර, එය භික්ෂු සංස්ථාවේ චිර පැවැත්මට හා පාරිශුද්ධිය පිණිස ප්‍රථම සංගීතියෙන් සිදු වූ ඉතා වැදගත් මෙහෙයක් ලෙස සඳහන් කළ හැකිය.

- ඡන්න හිමියන්ට බ්‍රහ්මදණ්ඩය පැනවීමද ප්‍රථම සංගීතියේදී සිදුවූ ඉතා වැදගත් කටයුත්තකි. ශාසනික නීතිරීති හා නියමයන්ට අනුව කටයුතු නොකොට අත්තනෝමතිකව කටයුතු කරන සාමාජිකයන්ට දඬුවම් විඳීමට සිදුවන බවට කදිම ආදර්ශයක් එමගින් සැපයේ. එහෙයින් ඒ සිදුවීම ද භික්ෂු සමාජයේ පාරිශුද්ධිය පිණිස ප්‍රථම සංගීතියෙන් ලැබුණු මහඟු පිටිවහලකි.

- දෙවන සංගායනාව පැවැත්වීමේ ප්‍රධානතම හේතුව ලෙස පාලි මූලාශ්‍රය සඳහන් කරන්නේ වජ්ජිපුත්තක භික්ෂූන් විසින් ඉදිරිපත් කොට පිළිපදින ලද දසවිධ අකැප වස්තුවයි. එය භික්ෂු සංස්ථාවේ පාරිශුද්ධභාවය පිළිබඳ බරපතල ගැටලුවක් නිර්මාණය කිරීමට හේතු විය. රන් රිදී ආදී මුදල් භාවිතය කැප ලෙස සැලකීම හා නොපැසුණු තෙලිදිය පානය ආදිය දස අකැප වස්තුවේ එන බරපතල කරුණු ලෙස සැලකිය හැකිය.

- සබ්බකාමී, යස, රේවත යන මහ තෙරවරුන්ගේ මූලිකත්වයෙන්, දසවස්තුව විනිශ්චය කිරීමට විනයානුකූල ව උබ්බාහිකාවක් පත්කොට, දසවස්තුවේ එක් එක් කරුණු වෙන වෙන ම විචාරා ඒවා ධර්ම විනය විරෝධී බව තීරණය කර ධර්මානුධර්ම ප්‍රතිපන්න 700 ක් වූ රහතුන් වහන්සේලාගේ සහභාගිත්වයෙන් දෙවන සංගායනාව පවත්වා, නැවත ධර්ම විනය සජ්ඣායනා කොට භික්ෂු සංස්ථාවේ පාරිශුද්ධත්වය තහවුරු කරන ලදී.

- දස වස්තුවට අනුගත ව කටයුතු කළ වජ්ජිපුත්තක භික්ෂූන් හා ඊට සහාය පළකළ දසදහසක් පමණ භික්ෂූන් අලජ්ජී, පාපී භික්ෂූන් ලෙස නම් කොට භික්ෂු සංස්ථාවෙන් නෙරපා හැරීම භික්ෂු සංස්ථාවේ පාරිශුද්ධිය වෙනුවෙන් දෙවන සංගීතියේදී ගනු ලැබූ අතිශයින් වැදගත් තීරණයකි.

- ශාසන පාරිශුද්ධිය පිණිස දෙවන සංගීතියේදී කාලාශෝක රජතුමාගේ අනුග්‍රහය ලබා ගැනීම ද මෙහි ලා වැදගත් වේ.

- තෙවන සංගීති සමය, එනම් බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 ක් ගත වූ කල නැවත භික්ෂු සංස්ථාවේ ඉතා බරපතල පරිහානිකර තත්ත්වයක් ඇති වූබව වාර්තා වේ. පාලි මූලාශ්‍රයන්ට අනුව ධර්මාශෝක රජුගේ ලාභ සත්කාරවලට ගිජු වූ බොහෝ අන්‍යතීර්ථකයෝ ලාභ අපේක්ෂාවෙන් සසුන්ගතව දුසිල් ජීවිත ගත කළහ. ඒ හේතුවෙන් භික්ෂු සංස්ථාව බෙහෙවින් කිළිටි තත්ත්වයකට පත්ව තිබුණි. ශික්ෂාකාමී භික්ෂූහු දුසිල් මහණුන් සමග එකට පොහොය කර්ම කළ නොහැකි නිසා සත් වසරක් මුළුල්ලේ පොහොය කර්ම සිදු නොකළහ.

- ධර්මාශෝක රජුගේ අනුග්‍රහය ලබාගත් මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේ ප්‍රධාන වගකිවයුතු මහතෙරවරුන් තෙවන සංගායනාව පවත්වා දුසිල් මහණුන් හැටදහසක් පමණ වෙන්කොට ඔවුන් උපැවිදි කොට නෙරපා හැර සසුන පිරිසිදු කරන ලදී.

- තවද ධර්ම විනය නැවත සජ්ඣායනා කොට ශාසනික පිරිසිදුබව හා චිරපැවැත්ම තහවුරු කරන ලද අතර, පිරිසිදු ථෙරවාදී සම්ප්‍රදාය භූගෝලීය වශයෙන් ද ව්‍යාප්ත කිරීමට රටවල් නවයකට බුදුදහම හඳුන්වා දීමට ධර්මදූත කණ්ඩායම් පිටත් කරන ලදී.

**(ලකුණු 10)**

## 06. (ii) කණිෂ්ක රජු විසින් සිදු කරන ලද ශාසනික මෙහෙය ඓතිහාසික සාධක ඇසුරෙන් ඇගයීමට ලක් කරන්න.

- හියුංසියැංට අනුව මෙතුමා උපතින් හින්දු භක්තිකයෙකි. ගොපලු දරුවෙකු හමුවීමත් සමඟ ඇති වූ ආශ්චර්ය අත්භූත සිදුවීමක් නිසා බෞද්ධයකු බවට පත් කණිෂ්ක රජතුමා එම ගොපලු දරුවා විසින් කුඩාවට සකසන ලද චෛත්‍යයක් විශාල කොට සාදවන ලදබව සඳහන් වේ.

- බෞද්ධයකු බවට පත් කණිෂ්ක රජු දිනපතා සිය මාලිගයෙහි වියත් භික්ෂූන් ලවා ධර්ම දේශනා පවත්වන ලද බවත්, එම දේශනාවලදී භික්ෂූන් වහන්සේලා ධර්මය අර්ථකථනය කිරීමේදී දක්වන වෙනස්කම් වටහාගත් රජු පාර්ශව වැනි වියත් භික්ෂූන් වහන්සේ සමග සාකච්ඡා කොට සිවුවන ධර්ම සංගායනාව සංවිධානය කරන ලද බවත් ෆාහියන් හා හියුංසියැං වාර්තාවල දැක්වේ. කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේ පැවති මෙම සංගායනාව පාර්ශව තෙරුන්ගේ නායකත්වය යටතේ පැවති අතර, එයට රජතුමාගේ පූර්ණ අනුග්‍රහය ලැබුණි.

- සිවුවන සංගායනාව පිණිස තත්කාලීන කීර්තිමත් සර්වාස්තිවාදී පඬිවරුන් වූ පාර්ශව, වසුමිත්‍ර, බුද්ධදේව වැනි තෙරවරුන්ගේ මෙන් ම, නාගාර්ජුන, අශ්වඝෝෂ වැනි මහායානික වියතුන්ගේ ද සහයෝගය ලබා ගත් බව සඳහන් වේ.

- රජු සියලු නිකායවලට අයත් කිරීතිමත් පඬිවරුන්ගේ අවවාද අනුශාසනා ලැබ රාජ්‍ය පාලනය සිදු කළේය.

- වියත් භික්ෂූන් වහන්සේ මෙතුමාගේ රාජ්‍ය සභාවේ ද කටයුතු කළහ.

- සිවුවන ධර්ම සංගායනාව අවසානයේ ත්‍රිපිටකයට විභාෂා ග්‍රන්ථ හෙවත් අටුවා රචනා කරන ලද අතර, ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දෙන ලදී.

- තව ද විභාෂා ග්‍රන්ථ තඹපත්වල ලියවා ශෛලමය මඤ්ජුසාවක බහා එය නිධන් කොට මහා සෑයක් ඉදිකරන ලදී. එම සෑය වර්තමානයේ පවා කාශ්මීරයේ දැකිය හැකි ය.

- සිවුවන ධර්ම සංගායනාවෙන් පසු කණිෂ්ක රජුගේ අනුග්‍රහයෙන් මධ්‍ය ආසියාව තුළ ධර්ම ප්‍රචාරක සේවාවක් ආරම්භ කරන ලදී.

- කණිෂ්ක රාජ්‍ය සමයේ භාවිත කාසිවල බුදුරුව ඇතුළත් කොට තිබීමෙන් මෙතුමා බුදුදහම පිළිබඳ දැක්වූ උනන්දුව පැහැදිලි වන අතර, බුද්ධ ප්‍රතිමාවේ ප්‍රභවයට අදාළ ව ද කණිෂ්ක යුගයේ භාවිත කාසි ඉතා වැදගත් සාධක ලෙස සැළකේ.

- ගන්ධාර බුද්ධ ප්‍රතිමා කලාව ආරම්භ වන්නේ ද මෙම රජුගේ කාලයේ මොහුගේ පාලන ප්‍රදේශයක් වූ ගන්ධාරයේ ය.

- පුරුෂපුරය (වර්තමාන පෙෂාවෝර් - පකිස්ථානය) තම රාජධානිය කොටගත් රජු එහි විශාල ආරාමයක් ඉදි කළේය. අවුරුදු හතලිස්දෙකක් වූ මෙතුමාගේ පාලන කාලයෙන් පසුව ද දීර්ඝ කාලයක් එම විහාර බුදුදහමේ චිරස්ථිතිය වෙනුවෙන් සක්‍රීය දායකත්වයක් සපයා ඇත.

- කණිෂ්ක රජතුමා විසින් අඩි 500 ක් උසැති විශාල චෛත්‍යයක් ගොඩනගා අටනැලියක පමණ ධාතු නිධන් කරන ලද බව සඳහන් වේ.

- කණිෂ්ක රජතුමා විසින් බුදුදහමට සිදු කරන ලද අපරිමිත මෙහෙවර නිසා එතුමා ද්විතීය ධර්මශෝක නාමයෙන් ද හඳුන්වා ඇත.

**(ලකුණු 10)**

**7. (i) ථෙරවාද බුදුසමයේ සුරක්ෂිතතාව පිණිස මහාවිහාරීය භික්ෂූන් විසින් සිදුකරන ලද මෙහෙවර විස්තර කරන්න.**

- ශ්‍රී ලාංකේය ථේරවාද බුදුදහමේ කේන්ද්‍රස්ථානය ලෙස මහාවිහාරය ක්‍රියාත්මක වීම.

- ථේරවාදී බෞද්ධ සම්ප්‍රදායයේ අනන්‍යතාවක් ලෙස විනයවාදී බව හඳුනාගත හැකි අතර මහා විහාරය ඊට අනුගත ව ක්‍රියා කිරීම.

- මිහිඳු මාහිමියන් මුල්වීමෙන් ශ්‍රී ලංකාවේ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුවණක් පිරිසක් ඇති වූ අතර මේ පිරිස ලංකාවේ විවිධ ප්‍රදේශවල විහාරාරාම ගොඩනගමින් බුදුසමය පතුරුවා හැරීමත් ක්‍රි. පූ. පළමුවන සියවසේ වලගම්බා රාජ්‍ය සමය උදාවන තුරු මිහිඳු හිමියන් ප්‍රතිෂ්ඨාපනය කළ ථේරවාදි බුදුසමය මහාවිහාරය කේන්ද්‍ර කොටගෙන ව්‍යාප්තවීමත් සුවිශේෂ වූ බව හා මේ නිසා රජුත්, ජනතාවත් බුදුසමය ආරක්ෂාකර ගැනීම සිය යුතුකම ලෙස සැලකීම.
- මහා විහාරය ථේරවාද අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වීම. ගිහි පැවිදි ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව ශිල්ප ශාස්ත්‍ර හදාරන ලද්දේ මහා විහාරයෙන් හා මහා විහාරානුබද්ධ පිරිවෙණ මගින් වීම.

- ථේරවාද බුදුසමයේ සුරක්ෂිතතාව වෙනුවෙන් සංඝ සංස්ථාව දේශීය කරණය කිරීමට පෙළඹීමත් විනය උගන්වා විනය සංගීතියක් පැවැත්වීමටත් කටයුතු කිරීම.

- සීහළට්ඨකථා සම්පාදනය කිරීම මගින් දේශීය වශයෙන් ථේරවාදී අර්ථකථන සම්ප්‍රදාය හඳුන්වාදීම. ඒ අනුව මහාට්ඨකථා, මහාපච්චරිය, කුරුන්දි, අන්දට්ඨකථා, සංඛේපට්ඨකථා ආදි අටුවා සම්පාදනය කිරීම.

- ථේරවාද ත්‍රිපිටක දහම සුරක්ෂිත කිරීමෙහිලා භාණක සම්ප්‍රදායක් ඇති කිරීම. එමගින් ත්‍රිපිටකය සහිත අටුවා සුරක්ෂිත කිරීම. ත්‍රිපිටකධර, විනයධර, ආභිධම්මික, සුත්තන්තික, චතුනිකායික, අට්ඨකථික ආදි භාණකවරුන් ඊට උදාහරණ යි. ක්‍රි. පූ. තුන්වන සියවසේ සිට ක්‍රි. පූ. පළමුවන සියවස තෙක් ථේරවාද ත්‍රිපිටකය හා අටුවා ආරක්ෂා කරන ලද්දේ මෙමගින් වීම.

- වලගම්බා රාජ්‍ය සමයේදී බැමිණිතියා සාගත සමයේදී මහා විහාරයීය භික්ෂූන් ත්‍රිපිටකය හා අටුවා මුඛ පරම්පරාගතව සුරක්ෂිත කිරීමට දුරු දුඩි පරිශ්‍රමය මූලාශ්‍රය තුළ සඳහන් වීම.
- බැමිණිතියා සාගතය මගින් ඇතිකළ බලපෑම් පදනම් කොටගෙන මාතලේ අලුවිහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම හා සංවර්ධනය කිරීම.

- ස්වාභාවික විපත් සමයන්හිදී මෙන්ම අභියෝග එල්ල වූ අවස්ථාවන්හිදී ථේරවාදී බුදුසමය ආරක්ෂා කිරීම. වෛතුල්‍යවාදී අදහස් හා ධර්මධාතු සංකල්පය වැනි අදහස් ද අභයගිරික අර්ථකථන ද නොපිළිගැනීම මීට උදාහරණ බව. මහසෙන් රජුගෙන් ඇති වූ අභියෝග හමුවේ නොසැලී ථේරවාදි බුදුදහම සුරක්ෂිත කිරීමට කටයුතු කිරීම.

- පාලි අටුවා රචනා කිරීමට මූලිකත්වයක් දීම.

- බුද්ධඝෝෂ හිමියන් ලවා ථේරවාද අර්ථ කථා න්‍යායට අනුව විසුද්ධිමග්ගය රචනා කර වීමෙන් උන්වහන්සේ පරීක්ෂාවට ලක්කොට සිංහල භාෂාවෙන් පැවැති හෙළ අටුවා මහා විහාර සම්ප්‍රදාය නොඉක්මවා පාළි භාෂාවට නැගීමට අවස්ථාව ලබාදීම. මෙමගින් ථේරවාදී සම්ප්‍රදායට අයත් අර්ථකථන සම්ප්‍රදායන් ස්ථාපනය කිරීමට හැකිවීම.

**(ලකුණු 10 )**

## 07. (ii) මියන්මාරයට බුදුසමය හඳුන්වාදීමේ ඓතිහාසික පසුබිම කෙටියෙන් ගෙනහැර දක්වා එරට ජන ජීවිතය බුදුසමයෙන් පෝෂණය වූ ආකාරය පැහැදිලි කරන්න.

**මියන්මාරයට බුදුසමය හඳුන්වා දීම**

- බුරුමයට බුදුදහම හඳුන්වාදීම සම්බන්ධ මතවාද, ජනප්‍රවාදාත්මක තොරතුරු, සාහිත්‍ය මූලාශ්‍රයාගත තොරතුරු හා පුරාවිද්‍යාත්මක සාධක ඇසුරින් හඳුනා ගත හැකි ය.

### ජනප්‍රවාදාත්මක තොරතුරු

- බුදුරදුන් ජීවමාන අවධියේදී බුරුමයේ පැරණි ජන කොට්ඨාසයක් වන මොන් ගෝත්‍රික තපස්සු භල්ලුක නමැති වෙළඳුන් දෙදෙනා විසින් බුදුරජාණන් වහන්සේට ප්‍රථම දානය පූජා කොට පූජාර්හ වස්තුවක් ඉල්ලූ කල්හි කේශධාතු මිටක් ලබා දුන්බවත්, ඒවා බුරුමයට ගෙන ගොස් සිංගුත්තර කඳු මුදුනේ දා ගැබක් ඉදිකොට එහි තැන්පත් කළ බවත් බුරුම ජාතිකයෝ විශ්වාස කරති.

### බුදුරජාණන් වහන්සේගේ වැඩමවීම් පිළිබඳ මතවාද

- බුරුම ශාසනවංසයට අනුව බුරුමයේ ඉරවඩී නදියේ බටහිර වෙරළ ආශ්‍රිතව පිහිටි අපරන්ත දේශයට බුදුරජාණන් වහන්සේ වැඩම කළ බවට මතයක් පවතී.

- සුනාපරන්තවාසී පුණ්ණ නම් වෙළෙන්දෙක් බුදුන් වහන්සේගෙන් බණ අසා පැවිදි ව රහත්ව එම ප්‍රදේශයට වැඩම කොට රත් සඳුන් දැවයෙන් ආරාමයක් කරවූබවත්, එහි වැඩම කරන අතරතුරදී සච්චබද්ධ තවුසාට ධර්ම දේශනා කළ බවත්, ඒ අසා රහත් වී ධර්මදූත පිරිසට එක් වූ බවත් සඳහන් වේ. ගමන අතරතුරදී නම්මදා නදිය අසබඩදී නම්මදා නම් නාග රජුගේ ඉල්ලීම පරිදි සිරි පා සටහන් තැබූ බවත් සඳහන් වේ. තවත් පා සලකුණක් සච්චබද්ධ කඳු මුදුනේ තබා ඇත.

- ධඤ්ඤවතී නුවර සිරිගුත්ත කඳු මුදුනෙහි පිහිටි මහාමුනි විහාරයට බුදුරජාණන් වහන්සේ වැඩම කළ බවට පවත්නා තවත් නිදර්ශනයකි. එහි වැඩ දහම් දෙසා නැවත පිටත් වීමට සූදානම් වන කල්හි වන්දානමාන කිරීමට බුද්ධ ප්‍රතිමාවක් පිහිටුවා යන ලෙස කරන ලද ඉල්ලීමකට අනුව ශක්‍ර දේවේන්ද්‍රයා විසින් බුදුරදුන්ට සමාන ප්‍රතිමාවක් තැනූබවත්, බුදුන් වහන්සේ එයට ජීවය ලබා දුන් බවත් සඳහන් වෙයි.

- තවත් ජනප්‍රවාදයක සඳහන් වන්නේ බුදුරජාණන් වහන්සේ ලේබයිං නම් ගමට වැඩම කොට සඳුන් දැවයෙන් ආරාමයක් තනමින් සිටි පිරිසකට ඒ සඳහා උපදෙස් ලබා දුන් බවත්, අනතුරු ව පැමිණ සිටි පිරිස ධර්මයෙහි පිහිටු වූ බවත් ය.

### සාහිත්‍ය මූලාශ්‍රයාගත තොරතුරු

- දීපවංසය, මහාවංසය ආදී ශ්‍රී ලාංකේය ඓතිහාසික වාර්තාවන්ට මෙන්ම වීදුරු මාලිගා වංසකතාව, නව පගාන් වංශකතාව ආදී බුරුම මූලාශ්‍රයන්ට අනුව ද බුරුමයට බුදුසමය ලැබෙන්නේ තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙනි. මහාවංසයට අනුව සුවණ්ණභූමියට සෝණ-උත්තර දෙනමගේ නායකත්වයෙන් භික්ෂූන් වැඩම කළහ. එහිදී ප්‍රථමයෙන් දේශනා කෙළේ බ්‍රහ්මජාල සූත්‍රයයි.

''සද්ධිං උත්තර ථෙරෙන - සොණ ථෙරො මහිද්ධිකො

සුවණ්ණභූමිං අගමා - තස්මිංතු සමයෙ පන''

යන මහාවංසාගත ගාථාවෙන් තහවුරු වේ.

**මියන්මාර් ජන ජීවිතය බුදුසමයෙන් පෝෂණය වූ ආකාරය**

- සෑම පිරිමියෙකු ම සිය ජීවිත කාලය තුළ තාවකාලික ව හෝ පැවිදි වූ අතර එය සාරධර්ම පෝෂණය විෂයයෙහි හේතු විය.

- පැවති ආගමික සමයවාදයන්ට සමගාමී ව නව අර්ථකථන සපයමින් බුදු දහම ජන හදවත්වලට සමීප කර විය.

- ශ්වේදගෝන් චෛත්‍යය ඉදිකර එහි සර්වඥ ධාතු තැන්පත්කොට ඒ වටා නාත් භූතයන් 37 දෙනාගේ ප්‍රතිමා තැන්පත් කරන ලදී.

- බුරුම සංස්කෘතිය තුළ පැවති නවග්‍රහ පූජාව බුදුදහම හඳුන්වා දීමේදී බුදුරජාණන් වහන්සේ ඇතුළු ශ්‍රාවකයන් වහන්සේලා 9 නමක් වෙනුවෙන් වෙන් කරන ලදී.

- ප්‍රාථමික අධ්‍යාපනය ආරාමය තුළින් ලැබීම අනිවාර්ය වූ අතර සෑම අයෙකු ම වසර දහයක් පමණ ආරාමික අධ්‍යාපනය ලැබිය යුතුය. බුරුම ජනයා පාලි භාෂාව, අභිධර්මය ඉගෙනීම කෙරෙහි අභිරුචියක් දක්වයි.

- බුදු දහමේ අභාසය නිසා කුල භේදය සම්පූර්ණයෙන් ම බැහැර වූ අතර එය සමාජ සාරධර්ම සංවර්ධනයෙහි ලා ප්‍රබල සාධකයක් විය.

- බුරුමයේ බෞද්ධ කලා නිර්මාණ එරට ජනයාගේ කලා කුසලතාව මූර්තිමත් කරනවා පමණක් නොව සාරධර්ම ජනනය කිරීම විෂයයෙහි ඒවායින් සෘජු දායකත්වයක් හිමි වේ. පැගෝඩා නමින් හැඳින් වූ ස්තූප නිර්මාණය ප්‍රධාන කලා අංශයකි. ස්වේදගොන් ස්තූපය, ස්වේශිගොන් දාගැබ, ආනන්ද ස්තූපය උදාහරණ ලෙස දැක්විය හැකිය.

- බුරුමයේ ආරාම, කලාගාරයක් හා සමානය. කැටයම්, මූර්ති, විවිධ වර්ගයේ ප්‍රතිමා වලින් සමන්විත වන එම ආරාමයන්හි බුද්ධ චරිතය, ජාතක කතා හා බෞද්ධ ඉතිහාසය පදනම් කොටගත් සිතුවම් නිර්මාණය ප්‍රමුඛවන අතර එමගින් ජන ජීවිතය බෞද්ධ සාරධර්මවලින් පෝෂණය විය.

- බුරුම කාන්තාවට සුවිශේෂ වටිනාකමක් හිමිවීම බුදුසසුනේ ආභාසයෙන් සිදුවූවකි. අධ්‍යාපනික නිදහස, ඡන්ද අයිතිය ලැබීම, තම අභිමතය පරිදි අධ්‍යාපනය ලැබීම හා විවාහ වීම ආදී සෑම ක්ෂේත්‍රයකම අයිතිවාසිකම් තහවුරු විය.

- බුරුම වැසියන් තුළ බෞද්ධ සංස්කෘතියේ ආභාසයෙන් ආගන්තුක සත්කාරය, කරුණාව, මෛත්‍රිය, චාම්බව වැනි ගුණධර්ම පෝෂණය විය.

**(ලකුණු 10)**

**8. (i) ශ්‍රී ලාංකේය ස්තූප නිර්මාණයේදී භාරතීය ස්තූප කලාවේ මූලික ආකෘතිය නවීකරණය වූ ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න.**

සාංචි ස්තූපයේ ලක්ෂණ

- ප්‍රදක්ෂිණාපථයක් (වේදි) පැවැති අතර එයට පිවිසීමට පියගැට (සෝපාන) පේළි තුනක් ඇත.
- ගර්භය මුදුනේ හර්මිකා නමින් හැඳින්වූ ගල් ගරාදි වැටක් සහිත හතරැස් කොටුවක් විය.
- හතරැස් කොටුව මත ශිලා ඡත්‍රය දරා සිටි යෂ්ටිය (යූපය) පිහිටා ඇත.
- යූපය මත ඡත්‍රයක් විය.
- ගර්භය අර්ධගෝලාකාරය.
- ස්තූපය වටා අලංකාර තොරණ හතරක් ඇත.

ලාංකේය ස්තූපවල ලක්ෂණ

- තුන් මහල් පේසා වළලු දක්නට ඇත.
  ඒ එක එකක් ක්‍රමානුකූලව කුඩා වන ලෙස නිර්මාණය කර තිබේ.
- මුල්කාලීන ලාංකේය ස්තූපවල ඉහළ පේසාවේ පිට ගැටිය දිගේ නියත පරතරයක් අතර ඇත්හිස් නිමවා තිබුණි. මෙය හත්ථිවේදිය නමින් හඳුන්වා ඇත. පසු කාලයේදී එය ඉවත්කර තිබේ.
- මුල්කාලීන ලාංකේය ස්තූපවල ගර්භයට සම්බන්ධව ලීයෙන් කළ මුදුන් වැටක් (මුද්ධවේදිකා) තිබුණි. පසුකාලයේදී එම නිර්මාණාංගය අභාවයට ගොස් ඇති අතර බදාමවලින් එය සංකේතවත් කර ඇත.
- මධ්‍යතන යුගයේදී ලාංකේය ස්තූපවලට දේවතා කොටුව නමින් හැඳින් වූ නවාංගයක් එකතුවිය. එය ඉදිකරන ලද්දේ හතරැස් කොටුව මත ය.
- දේවතා කොටුවෙහි සතරවරම් දේව රූප නිර්මාණය කරන ලදී.
- මුල්කාලීන ලාංකේය ස්තූපවල ද යූපය සවිකර තිබුණි. පසු කාලයේදී එය ඉවත්කර ඒ වෙනුවට කොත්කැරැල්ල යොදන ලදී.
- මුල්කාලීන ලංකාවේ ස්තූපවල එක් ඡත්‍රයක් පැවැතිණි. පසුකාලයේදී එය ඡත්‍රාවලියක් බවට පත්විය. අනතුරුව ඡත්‍රාවලිය වෙනුවට කොත සවිකරන ලදී.
- කොත මත චූඩා මාණික්‍යයක් විය
- ගර්භයේ හැඩය අනුව ලාංකේය ස්තූප ප්‍රධාන ආකෘති හයකට වර්ග කළ හැකි ය.
  * ඝණ්ඨාකාර -අනුරාධපුරයේ ථූපාරාමය, ලංකාරාමය
  * ඝඨාකාර -කතරගම කිරිවෙහෙර, සෝමාවති ස්තූපය
  * බුබ්බුලාකාර -රුවන්වැලිසෑය, අභයගිරිය, ජේතවනය
  * ආමලකාකාර -මිහින්තලේ කණ්ඨක චෛතිය

* පද්මාකාර -දෙමළ මහා සෑය හා යුදඟනා ස්තූපය මේ වර්ගයට අයත් වන්නට ඇතැයි සැලකේ.

* ධාන්‍යාකාර -කැලණි ස්තූපය

යනාදි කරුණු පදනම් කරගෙන පිළිතුර සකස් විය යුතුය.

**(ලකුණු 10)**

**8 (ii) බෞද්ධ සාරධර්ම ජන විඥානයට සම්ප්‍රේෂණය කිරීමෙහිලා කෝට්ටේ යුගයේ සිංහල පද්‍ය සාහිත්‍ය රචකයන් විසින් ගන්නා ලද උත්සාහය ලෝවැඩ සඟරාව ඇසුරෙන් ඇගයීමට ලක් කරන්න.**

- ලෝවැඩ සඟරාව කෝට්ටේ යුගයේ විසූ වීදාගම මහා මෛත්‍රී හිමියන් විසින් රචනා කරන ලද උපදේශ කාව්‍ය ග්‍රන්ථයකි.
- පාලි ධර්මය නොදත් ජනතාවට කර්මඵල විපාක සිංහලෙන් පහදාදීම මෙම කෘතිය රචනා කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වී තිබේ.
- ධර්මය නොදන්නවුන් හට පින් පව් නියම කර දැක්වෙන බණ පොතක් වශයෙන් ද මෙය සලකා ඇතිබව ග්‍රන්ථය අවසානයේ දැක්වෙන පහත සඳහන් පද්‍යයෙන් පැහැදිලි වේ.

නො දැනෙනුවන් හට පව් පින් නියම කොට
බඳ ලෝ වැඩ සඟරා පිණෙනි හැම විට
ලද සැපතින් තොර නො ව ලැබ නිති පිහිට
වැද සව් සත සැනසෙත්වා මොක් පුරට

- මෙම ග්‍රන්ථයෙන් ජන විඥානයට සම්ප්‍රේෂණය කිරීමට උත්සාහ දරා ඇති බෞද්ධ සාරධර්ම රැසකි.
- බණ අසන ආකාරය, පින් පව් වෙන් කර හඳුනාගැනීම ආදි කරුණු රැසක් එහි අන්තර්ගත වේ.
    1. බිම ඉඳ කී බණ සිට ගෙන නො ඇසියයුතුය.
    2. බණ කීවොත් කැමැත්තෙන් විමසිලිමත් ව ඇසියයුතුය.
    3. මිථ්‍යාදෘෂ්ටි ගත් අයට පින් කළ නොහැකිය.
    4. මනුෂ්‍ය ආත්ම භාවය ලැබීම ඉතා දුර්වල කටයුත්තක් බවත්, නිරය, තිරිසන් යෝනිය, ප්‍රේත භවය, පිටසක්වල ආදී ස්ථානවල උපත ලැබීම පිං කිරීමේ අවස්ථාව අවුරාලනබව
    5. මරණය පසු පසින් පැමිණෙන බැවින් ප්‍රමාද නොවී පින් කළයුතුය.
    6. පින් නොකරන පුද්ගලයාට සිදුවන්නේ අපාගත වීමට ය.
    7. කුසල් කිරීමට වීර්ය කළයුතුය.

8. පුණ්‍ය ක්‍රියා කිරීමට සිත පහදා ගතයුතුය.
9. බල්ලා මස් ලේ නැති ඇට ලෙවකෑවත් බඩ පිරීමක් නම් නැත. එබැවින් මෙලොව සැපයට ද ලෝභය ඇතිකර නොගත යුතුය. ආශා කිරීමෙන් දුක් ම ඇති වේ.
10. පව් කරන කලට මී සේ මිහිරි ය. එහෙත් දුක් විඳින කලට ගිනි සේ දැඩි ය. එබැවින් තිදොර සංවර කර ගත යුතු ය.

කරන කලට පව් මීරිය මීසේ
විඳින කලට දුක් දැඩිවෙයි ගිනිසේ
ඇඳින එ පව් දුර ලන උපදේසේ
නුදුන මැනැවි තුන් දොර අවකාසේ

11. අධාර්මික වැඩ කරමින් ජීවත් වෙනවාට වඩා ධාර්මික ලෙස මිය යාම යහපත් ය.

අදමින් ජීවත් වෙනවා විතරට
දැහැමින් මියයනු සොඳමැ යි දන හට
මෙලෙසින් වදහළ මුනි බණ සිහිකොට
සැබැවින් පින් කොට පැමිණෙව් නිවනට

12. ළිපේ ගිනි මොළොවන තුරු ළිප මත වූ දිය සැළියේ උන් කකුළුවා සැපයක් යැයි සිතා ජල ක්‍රීඩා කරයි. එසේම පංච කාම රස විඳීම නම් වූ ක්‍රීඩාවේ ද සැපයක් නැතිබව වටහා ගතයුතු ය.
13. දන්දීම වැනි පින්කම් කිරීම බැරි වැඩකැයි නො සිතිය යුතු ය.
14. දුක් විඳ රැස් කළා වූ ධනය හැර දමා අපායට යාම මිනිසුන්ගේ සිරිත ය. එහෙත් නිවන ලබාදෙන පිරිසිදු ශීලය ආරක්ෂා නො කරති.
15. විනාශ කළ යුත්තේ ලෝභ, ද්වේෂ සහ මෝහය යි. වාසය කළ යුත්තේ ශ්‍රද්ධාවන්තයන් ඉන්නා ප්‍රදේශයක ය. ඇසිය යුත්තේ බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය යි.
16. කවර උපායෙකින් නමුත් පරපණ නැසුවොත් සතර අපායේ අපමණ දුක් විඳීමට සිදුවෙයි.

බුදු බණ අසමින් සිත සතපායේ
කුරුපණ කම් ඇර පිය ඒ පායේ
පර පණ නැසුවොත් කවර උපායේ
අපමණ දුක් දෙයි සතර අපායේ

17. පර සන්තක දෙය සොරකම් නොකළයුතු ය. කවට කමට කළ සොරකමක් නිසා දෙව් දුවක් ලෙස ඉපදුනත් විළි වැස්මක් නොලැබුණි.

18. එක් වතාවක් බොරු කී පුද්ගලයාට වුවද දෙවු ලොවට යන පාර වැසේ. නරකයෙහි දුක්විඳීමට සිදුවේ. එබැවින් බොරු නොකියයුතු ය.

19. පරුෂ වචන කීම මහ වරදකි. එහි විෂ මෙලොවදී ම ලැබේ.

20. අනුන්ගේ සැපත දැක ලෝභ නොකළයුතු ය.

21. තමන් කැමැති නැති ජනතාවට ක්‍රෝධ නොකළයුතු ය.

22. දස අකුසලවලින් වෙන් වියයුතු ය.

23. කේළාම් කීම නරකාදියෙහි ඉපදීමට හේතුවකි.

24. සම්ඵප්‍රලාප නොකියයුතු ය.

25. පින් නොකරන අසත්පුරුෂයන්ගේ වචන විශ්වාස නොකළ යුතු ය. සිත පහදා ගෙන නිතර පන්සිල් හා පෝය දිනවල අටසිල් රැකියයුතු ය.

26. මෛත්‍රී භාවනාවේ යෙදීම උතුම් පිනකි.

27. මහා සංඝයා වහන්සේලාට, දෙමාපියන්ට, ගුරුවරුන්ට, මහලු බවට පැමිණි නෑයන්ට, රෝගීන්ට, තාපසයන්ට උපස්ථාන කිරීමෙන් දෙවු ලොව සැප උදාකරගත හැකි ය.

28. තමාගේ සිත පහදාගෙන කළා වූ පින් දීම නම් දිව්‍ය ලෝක හයට නැඟීමට බැන්දා වූ රන් ඉණි මඟක් වැනි ය. එබැවින් පින් අනුමෝදන් කළයුතු ය.

29. පෙර විසූ කාන්තාවක් එළු දෙනක්ගේ හිස කපා මැරීම හේතුවෙන් මුළු ඇඟෙහි වෙලාගත් අපායේ ගිනි ජාලාවලින් දුක් විඳ එළු දෙනගේ ඇගේ ලෝම ගණනේ ඉස් කැපුම් ලදුවා ය. කාටත් අකුසලය පලදීමේ ආකාරය මෙබඳු ය.

පෙර අඟනක් එක් එළු දෙනක ඉස සිඳ
සිය ලඟ වැලැඳි ගිනි දැල් නිරය දුක් විඳ
ඇය ඇඟ ලෝම ගණනේ ඉස් කැපුම් ලද
මෙම රඟ වේය කාටත් අකුසලේ ලෙද

30. බුදු බණ අසා සිත සන්සුන් කරගෙන සිටි මැඩියෙක් කෝටුවක් ඇණී මියගොස් දෙවු ලොව ඉපදුනේය. එබැවින් ධර්මය ඇසීමට කම්මැලි නො වන්න.

බුදුන් දෙසන බණ මිහිරෙන් ම සිත තැනී
පසන් ව උන් මැඩියෙක් කැවිටකින් ඇනී
එයින් චුත ව සුර සිරි ලදිය දූහැමිනී
මෙවන් දහම ඇසුමට මැළි නො වවු දූනී

31. දුප්පත් පුද්ගලයෙක් සිත පහදාගෙන එක් දාගැබකට දිය බෙරලිය මලක් පූජා කිරීමේ පිණෙන් සත්තිස් වරක් සක්විති රජකම ලැබීය. එබැවින් අකුසල්වලින් මිදි කුසල් කරන්න.

32. සීලවන්ත අයට නිතර වතාවත් කරන්න.

(ලකුණු 10)